**වර්ෂ 2022 අප්‍රේල් 08 වන දින පෙ.ව. 09.00 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **සභාපතිතුමා මුලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.00 වන විට සණ පූර්ණය නොමැති හෙයින් විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 09.30 දක්වා කල්තැබීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමියන්ලා සහභාගි විය.

අනු

**වර්ෂ 2022 අප්‍රේල් මස 08 වන දින පෙ.ව. 09.00 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **සභාපතිතුමා මුලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.00 වන විට සණ පූර්ණය නොමැති හෙයින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ප්‍රේමා ගම්ලත් මිය විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 9.30 දක්වා කල්තැබීමට යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි දයා කස්තුරි මිය විසින් ස්ථිර කරන ලදී.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමියන්ලා සහභාගි විය.

| අනු.අ තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|
| 1. ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 08.10 |
| 2. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 08.15 |
| 3. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 08.47 |
| 4. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 08.50 |
| 5. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 09.15 |
| 6. ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 09.15 |
| 7. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 09.17 |
| 8. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.පී.තරංග නිල්මිණි මහතා | පෙ.ව. 09.20 |
| 9. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | දීප්ති චන්දන මහතා | පෙ.ව. 09.20 |
| 10. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | එස්.ඩබ්.රන්ජිත් මෙන්ඩිස් මහතා | පෙ.ව. 09.21 |
| 11. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 09.20 |
| 12. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | රොෂාන් දේශප්‍රිය මහතා | පෙ.ව. 09.20 |
| 13. ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජී.එම්. ජයරත්න | පෙ.ව. 09.20 |
| 14. | | | |
| 15. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 09.30 |
| 16. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 09.30 |
| 17. ගරු ප්‍රාසම | එ.ජා.ප. | අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා | පෙ.ව. 09.30 |
| 18. ගරු ප්‍රාසම | එ.ජා.ප. | කේ.එල්.එම්.ඩී.කරඳන මිය | පෙ.ව. 09.30 |
| 19. ගරුප්‍රාසම | එ.ජා.ප. | ජී.ඊ.ඒ. රනිල් එදිරිසිංහ | පෙ.ව. 09.50 |
| 20. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක පතිරණ මහතා | පෙ.ව. 09.50 |
| 21. | | | |
| 22. ගරු ප්‍රාසම | එ.ජා.ප | මුදිතා ශ්‍රීමතී සෝමරත්න මිය | පෙ.ව. 09.50 |
| 23. ගරු ප්‍රාසම | එ.ජා.ප | නයනා ජීවනි අතුකෝරල මිය | පෙ.ව. 09.50 |
| 24. ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ මිය | පෙ.ව. 09.50 |
| 25. ගරු ප්‍රාසම | එ.ජා.ප | චන්ද්‍රලතා බණ්ඩාර මිය | පෙ.ව. 09.50 |
| 26. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 09.51 |
| 27. ගරු ප්‍රාසම | එ.ජා.ප | අයි.කේ.කුලරත්න මහතා | පෙ.ව. 10.10 |
| 28. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදුෂාණි වීරසිංහ මිය | පෙ.ව. 10.10 |
| 29. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මාලනී පීරිස් මිය | පෙ.ව. 10.10 |
| 30. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 10.12 |
| 31. ගරුප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | චන්දිම යුරේශ් පතිරණ මයා | පෙ.ව. 10.15 |
| 32. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා | පෙ.ව. 10.15 |
| 33. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයා කස්තුරි මිය | පෙ.ව. 10.20 |
| 34. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩී.එම්. ශානක දර්ශන මහතා | පෙ.ව. 10.20 |
| 35. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා | පෙ.ව. 10.20 |

| | | | |
|---|---|---|---|
| 36. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා | පෙ.ව. 10.22 |
| 37. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රවීන් විනෝද් මහතා | පෙ.ව. 11.00 |
| 38. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.එච්.අසංක එරන්ද මහතා | පෙ.ව. 11.00 |
| 39. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා | පෙ.ව. 11.00 |
| 40. ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජීවන් රණතුංගමහතා | පෙ.ව. 11.00 |
| 41. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | බී.ජී. ජීවන් අබේවික්‍රමපාල | පෙ.ව. 11.01 |
| 42. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 11.01 |
| 43. ගරු ප්‍රාසම | එ.ජා.ප. | ප්‍රභාත් ජයසූරිය | පෙ.ව. 11.30 |
| 44. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මංගල කිත්සිරි ඩයස් මහතා | පෙ.ව. 09.10 |

01-01 **<u>සභා වාර්තාව සභා සම්මත කිරීම.-(2022.03.11)</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>**

2022.03.11 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා :-</u>**

2022.03.11වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව ස්ථිර කරමි.

**<u>1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති විජේසිරි මහතා :-</u>**

**ගරු ධනවර්ධන මන්ත්‍රීතුමා දෙන ලද පරිත්‍යාග සම්බන්ධව මා විසින් ඇගයීම කල බව ඇතුලත්විය යුතුය.එසේම මා විසින් අදහස් දැක්වීමේදි කොස්ගෙඩිය මන්ත්‍රී ලෙස මා විසින් සඳහන් කල වචනය ස්වාධින මන්ත්‍රී ලෙස සඳහන් විය යුතුය.**

**2.**ගරු ධනවර්ධන මන්ත්‍රීතුමා සම්බන්ධව මා විසින් විශේෂ ඇගයීමක් කල බව සඳහන් විය යුතුය.

**Xxxxxxxxxxxxx** 2022.03.11 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව **ඒකමතිකව මහා සභා සම්මත විය. Xxxxxxxxxxx**

**ප්‍රේමරත්න මල්කැකුල,**
**ගරු සභාපති,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට**

2. <u>සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන -</u> නොමැත.

3. <u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද ලිපි සංදේශ , පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන -නොමැත</u>

4. <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :-</u> නොමැත

<u>''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''</u>

5. <u>යථා පරිදි කල්දී ඇති යෝජනා :-</u>

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**<u>05-01.</u>** සියක් නගර සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කළ කුරුවිට නගරයේ ,දුම්රිය ගොඩනැගිල්ල ඉදිරිපිට ඇති එළිමහන් පරිශ්‍රය වාහන හා වෙනත් රථ ඇතුළු කිරිමට නොහැකි ලෙස සැකසීම හා අලංකාර කිරීමේ යෝජනාව

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මෙම ස්ථානය වාහන ඇතුල් නොකල යුතු විවේකීය ස්ථානයක් ලෙස පැවතිය යුතු උනත් දැන් මේ ස්ථානය වාහන නැවතුම් තැනක් වෙලා.එසේම මේ ස්ථානයේ එහා පැත්තට යන් මාර්ගයකුත් තියෙනවා. මේ ස්ථානය අලංකාරව පවත්වාගෙන යායුතු තැනක්. කාර්මික නිලධාරිඋපදෙස්මත මේ තැන සංවර්ධනය කරමු.ඒ අනුව සියක් නගර සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කළ කුරුවිට නගරයේ ,දුම්රිය ගොඩනැගිල්ල ඉදිරිපිට ඇති එළිමහන් පරිශ්‍රය වාහන හා වෙනත් රථ ඇතුළු කිරිමට නොහැකි ලෙස සැකසීමට හා අලංකාර කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි. සියක් නගර සංවර්දන ඬැඩසටහන යටතේ කුරුවිට නගරයේ ගොඩනැගිලි අලංකාර කරලා.නමුත් භාර දීලා නෑ.ඒත් ඒ මල් පැල ආදිය නඩත්තුව සභාව සතු විය යුතුයි. මම ගිය සබාවේ කීවා නගරයේ නිතර පිරිසුදුවට සනීපාරක්ෂක සේවකයෙක් දෙන්න කියලා.දැන් පෙනි යනවා එය අත්‍යවශ්‍යයි කියලා.ඒ පරිශ්‍රය ඉන්ටර්ලොග් ගල් දාලා හදලා තියෙනවා.මේ ගොඩනැගිල්ලේ එක අඩුවක්.වැසිකිලිනෑ.වාසු ගරු ඇමතිතුමා මුදල් දිලා කෙරෙනවා කීවට කෙරෙන පාටක් නෑ. මේ ගොඩනැගිල්ලටත් වැසිකිලියක් ඕනි.වොෂ් රූම් එකක් ඕනි.කාන්තා පිරිමි වෙනවෙනම ඕනි.ගල් අල්ලපු ස්ථානයේ ක්‍රමවත්ව හා අලංකාරව

කොන්ක්‍රිට් පුටු ටිකක් තියමු.වාහන ඇතුලට ගන්න බැරිවන ලෙස ඒවා ස්ථාපිත කරමු.සිරිපා සංචාරකයින් ආදි සංචාරකයන්ට වාඩිවිය හැකි ලෙස පුටු තියමු. කෝටි ගානක් දිලා හදපු එකේ ගල් බංකු ටිකක් තියමු.එසේම මම ඊයේ දුරකථන ඇමතුමක් දුන්නා ඒඩිබි ගොඩනැගිල්ල හා සමුපකාරෙට යන පාරේ පස් දාලා.ආර්.ඩී එකෙන්.ඒ ටික ඉවත් කරලා දෙන්න.අවුරුදු කාලේ පොඩි කඩ හැමතැනම.ඒ මාර්ගය හරස් කරලා තාවකාලික වෙළඳ කුටියක් දාලා.වසර පුරා වෙළඳාම් කල අයට බිස්නස් නෑ.ලේකම් තුමිය දැනුම් දුන්නා පස් ඉවත් කල බවට.ස්තුතියි.මේ යෝජනාව පරිදි මේ කටයුත්තට වෙන් කරනමුදල උපරිම ඵල ලැබෙන ලෙස සිදු කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

පාර එහා පැත්තට යන්න තියෙන තැන ඒ තැන කඩය හයටත් කඩලා තිබුනේ නෑ.මගේ වාහනයත් දාන්න අමාරු උනා.ඔර්ලොසු කණුව ලඟ.එතනින් යන්නත් බෑ. අවුරුදු කිය කියා හැමතැනම කඩ.පාරේ හැම තැනම වෙළඳාම් නොකර පිට්ටනිය වගේ තියෙන හරියේ කරන්න කියන්න.පදික වේදිකාවේ කාටත් යන්න බෑ.ස්ලැබ් උඩත් කඩ.වාහන නතර කරන්නබෑ.පාලනයක් කරන්න ඕනි.යූඩී එකටත් කීවා සභාවටත් කීවා දුම්රිය ගොඩනැගිලි නිර්මානශීලිව හදමු කියලා.ඒත් ඒ කණු වල ඉරි කොටු වගේ තිබුණා.දැන් ඒවා නෑ.ලී කපලා ඉවත් කරලා.උළු ඉවත් කලා.සභාවෙන් කඩ ආවරනය කරන්න පසු කාලිනව හදපු බැම්මත් සංරක්ෂනය කරලා.ඒක සභාවෙන් හදපු බිත්ති දෙකක්.පෞරානික නෑ.වියදම් කල මුදල් මදි කියලා කටයුතු නතර කරලා. මං සමුපකාර සභාපතිට කීවා සමුපකාර මුදලින් හදාගන්න කියලා.කැතයි.
ලොවි බංකු වැඩේ ගැලපෙනවා.කුඩ දාලා හැදුවාමත් හොඳයි.නමුත් මේ ගොඩනැගිලිවල වැඩ නිම කරන්න ඕනි.අපිට කතා කරන්නත් බෑ.නිරික්ෂනය කරන්න අපිට,සභාවට අවසර ගන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා -</u>

හැමතැනම කඩ,ත්‍රී වීල් ,පැත්තකට කරමු.අපේ ඒ මරනය වුනේ සයිඩ් කන්නාඩියේ හැපිල.තවත් ඒ වගේ වෙයි. ආදායම් පරිපාලකලා මේ කඩ හදන තැන් පෙන්නලා දෙන්න.කඩ දීපු අයත් ආයෙත් අළුතින් කඩ දාලා.පදිකයන්ට යන්නත් අමාරුයි. අපි සභාවෙන් කුටි දාලා දුන්නනම් හරි.අත්‍යවශ්‍ය බඩුටික අරන්. ඒත් කල් මදි.නැත්නම් කඩ පේලි 100 විතර හදන්න තිබුණා.අපිට පිලිවෙලට කරන්න තිබුනා.ලබන වසරේවත් ක්‍රම වේදයකට කරමු.හැමදාම ඉන්න කෙනා මයි වෙළඳාම.ගමෙන් එන දුප්පත් කෙනාට මොකුත් නෑ.ඒ අයගේ ජන්දෙන් අපි ආවේ.දැන් කාලේ මදි.පස්සෙ මේ වගේ අවස්ථාවල සැලසුමකට දෙමු. නගර සභාව අවුරුදු කලාපය කියලා ගහලාම දිලා. ලොරි පාක් එකෙන් භාගයක අපිටත් කරන්න පුළුවන්.අර දුම්රිය ගොඩනැගිල්ල තියෙන විධිහට මොකුත්කරන්න බෑ.කෑලි දෙකක් දෙපැත්තට.මැදින් එකක් තියෙනවා.සභාවට ආදායම් එයි කියලා හිතුවේ.කෝටි 200 නම් ගිහින්නෑ.ලක්ෂ 200 නම් යන්න ඇති.බිල්ඩිම රෙපෙයාර් එක කහ පාට හුණු ටිකක් ගාල.ඒකෙ තිබ්බ වයිරං ගතිය නෑ.ආරුක්කු බැලුවොත් පෙනෙයි.යූ.ඩී. කියන්නෙත් ජනතා මුදල්. දේශපාලනය නෙමේ .හොඳට කරලා නෑ.මේ සේරම එකතුවෙලා ජනතාව වෙනුවෙන් වැඩ කල යුතු වෙලාවක්.අපි එකතු වෙලා රටට ආදරයෙන් වැඩ කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේ කුමාර මහතා -

**කුරුවිට බස් නැවතුම තෙමෙනවා.අධික වර්ෂාවට බස්වල වතුර පාරත් නැවතුම ඇතුලේ.තෙමෙනවා. මේ ගැන අවධානය යොමු කරන්න.**

**සතියකට කලින් ටැංකිය ලඟදි නගරයට ආ පුද්ගලයෙකුගේ පර්ස් එක අරන්. සපත්තු මහන අයළු අරන් තියෙන්නේ .පොලිසි ගිහින් .මේක නගරයේ ආරක්ෂාවට හොඳ නෑ. සපත්තු මහන අය එතනින් ඉවත් කරන්න.ජනතාවට ගැටළු වක්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරල මිය.

**දුම්රිය ගොඩනැගිල්ල ගැන මම මීට ඉහතදි මේ සභාවට කිවා.ඒත් ඒ අවස්ථාවේදි කීවේ මම ලකුණු දාගන්න හදනවා කියලා.මං කීවේ ආකෘතිය වෙනස් නොකර තියන්න කියලා.කුරුවිට නගරයේ පෞරාණික කම රැකෙන විධිහට.සංචාරක ආකර්ශනය ලැබෙන පරිදි සංවර්දනය කරන්නයි.මේ ගැන සොයා බැලුවානම් අද මෙහෙම වෙන්නේ නෑ. පරීක්ෂනයක් කරමු අපි සියළු දෙනා ගිහින්. හෙල බොජුන් හදාගමුද? සභාවට ආදායමක්.හෙල බොජුන් හලට මේ ගොඩනැගිල්ල දෙන්න කියා මා ඉල්ලා සිටිනවා.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**මේ අදහස් අනුව කුරුවිට නගරය විවේකීව ආරක්ෂා සහිතව සිටිය හැකි ස්ථානයක් ලෙස ගොඩ නගමු.නාගරික සංවර්දන අධිකාරිය තාම අපිට දීලා නෑ.ඒ අය එකතු කරලා සොයා බලමු.මහින්ද මන්ත්‍රී තුමා කීවා සොරකම් වෙනවා කියලා.මේ ගැන පොලිස් ස්ථානාධිපතිතුමාට හා අදාල අංශ වලට දැනුම් දෙමු. මේ දුම්රිය ගොඩනැගිල්ල කටයුත්ත සිදුකෙරුනේ සම්පූර්න යූ.ඩී එක හරහා.අපි එක සාකච්ජාවකට ගියා විතරයි.ලී.උළු ටික දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ගෙනිච්චා. ඒ වීදුරු ගොඩනැගිල්ල පත්තරේ දැනුම් දිලා හොඳ කම්පැනියකට දෙමු.දෙමහල් එක සමුපකාර සමිතියට බදූ අරන්ළු. ගැටළු නෑ. කෙසේ හෝ නගරෙට ගැලපෙන ලෙස කරන්න ඕනි.නැත්නම් අපි ඉල්ලමු හෙල බොජුන් හලට.කුරුවිට නගරය සුව පහසු තැනක් කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව සියක් නගර සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කළ කුරුවිට නගරයේ ,දුම්රිය ගොඩනැගිල්ල ඉදිරිපිට ඇති එළිමහන් පරිශ්‍රය වාහන හා වෙනත් රථ ඇතුළු කිරිමට නොහැකි ලෙස සැකසීමට හා අලංකාර කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-02.** කාපට් කිරීමට යෝජිත මෙනේරිපිටිය අළුපොත මාර්ගය පුළුල් කිරීම සඳහා දෙපස ඇති ඉවත් කලයුතු ගස් ඉවත්කර සංවර්ධනය කිරීමේ යෝජනාව

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

කාපට් කිරීමට යෝජිත මෙනේරිපිටිය අළුපොත මාර්ගය පුළුල් කිරීම සඳහා දෙපස ඇති ඉවත් කලයුතු ගස් ඉවත්කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි. එල්ලාවල 3 කනුව උක්හේන මාර්ගයේත් මෙය ප්‍රාදේශිය සභා පාරක්.කාපට් ව්‍යාපෘතිය යටතේ වැඩ අවසන්.ඒ ආයතනය ඉල්ලීම් කලා.වංගුව පෙනෙන්නේනෑ.කනුග්ගල්ල එහා පැත්ත.අපිට මැදිහත්වෙන්න කීවා.දෙපැත්ත පේන්නෑ.පෙරත් කීවා.අවුරුදු නිවාඩුවට පෙර කටයුතු කරන්න.පරීක්ෂා කරන්න.කාර්මික නිලධාරි යායුතුයි.යු.ඩී. එකට බෑ. ඒ කටයුත්ත කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

මාස ගානකට පෙර කිවා පෙට්ටි මඩුව පාර මිල්ල ගහ ගැන.තාම උනේ නෑ.වලඳුර පාරේ බර වාහන කොට අදිනවා.කාර්මික නිලධාරි යවලද? මුදල් බැදලද?

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිප්ති චන්දන මහතා</u>

උප සභාපතිතුමා කිව මාර්ගය ඒක කොටස් ඉතිරි කරලා තිබුනේ.කාපට් එකට සමාන්තරව කාපට් වෙන්න ඕනි.බෝක්කු හදන්න ඕනි තැන්වල බෝක්කු නොදා නිකං කාපට් කරලා.ගල් බැම්ම උඩ කොන්ක්‍රිට් කරලා. බරපතල හානියක් වෙයි.සමුපකාරය ඉදිරිපිට ඉඩ තියලා තිබුනා.බෝක්කුවදාන්න.සමාන්තර නෑ.වාහන යනකොට පාත් වෙයි. මේක වංචාවක්.පොහොරබාව, කනුග්ගල්ල මාර්ගය.නිවැරදි කරන්න.ඒ මුදල් අපතේ යන්න බෑ.හරි දේ කරන්න ඕනි.පරීක්ෂනයක් කරන්න.
මම කියන්නේ මේක නිසිපරිදි කරලා නෑ.නිසි ස්ථානවල යෙදිය යුතු ඉදි කිරීම් කරලා නෑ.බෝක්කු කීපයයි හදලා තියෙන්නේ.සමාගම් සමග කතා කරලා මේක නිවැරදි කරන්න.බරපතල අක්‍රමිකතා වෙලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

කරපිංච ප්‍රධාන මාර්ගය කාපට් කරනවා.පාර විශාල හානි ලෙස මහෝගනී ගහක් තියෙනවා.සභාවෙන් ගිහින් බැලුවා.වත්තට අයිති මහෝගනි ගහ.අතු කැපුවේ නැත්නම් ඉදිරි සුලඟට හානි වෙයි. රංජිත් බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා කාපට් අතුරවලා තියේනනේ.ස්ථාන කිපයක බෝක්කු නෑ.වෙන හේතු මත අතෑරලා.ගිය රජය කාපට් කරලා නවතපු තැන ඉඳන් පාරේ යන්නම බැරි තරම් .ස්ථාන 5ක් අතෑරලා.ගල් ගොඩ ගැහිලා.පැතිබැම්ම හදන ස්ථානයේ දැන් මහා ආරවුලක්.තව ස්ථාන වල ඛනිජ සම්පත් මන්ත්‍රීලා අරන් ගිහින්.ඒවා නොවෙන්න ඕනි.බර වාහන කිපයක් අරන් ගියා පස් පුරවලා. කරපිංච කෝවිල ලඟ.මං ලඟ වායාරූප තියෙනවා.මහජනයා බලා ඉන්නවා.සංවර්ධනය නිසි පරිදි සිදුවෙන්න ඕනි.

ගල් දාලා හදන්න ඕනි.ඉල්ලං පස් තියෙන තැන ලොකුවට කාණු දාලා හදනවා.කළු ගල් නිකං දාලා. උඩින් පස් දැම්මම ඉවරයි.මුදල් අනුමත කල මන්ත්‍රීටත් ගැටළු.මේ ප්‍රධාන මාර්ගයේ අවශ්‍ය තැන්වලට ගල් අතුරලා ස්ථාන හදන්න.මේ ක්‍රමයට විරුද්ධයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතා.

එම මාර්ගය ඉතා ප්‍රමිතියෙන් යුක්තව සකසා ඇත.සෘජු කම්කරු ශ්‍රමය යටතේ කල අතර

මෙම මාර්ගයේ බොහෝ ස්ථාන වල ඉල්ලං ඇත.නමුත් මෙම කටයුතු ප්‍රමිතියෙන් යුතුව සිදු කර ඇති නිසා පරීක්ෂා කර බැලිය හැකියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා -

මේ මාර්ගය ශක්තිමත්ව හැදිය යුතුයි.හදන අවස්ථාවක අක්‍රමිකතා වෙනවා නම් මටත් දන්වන්න. මාර්ගය කැණිම් වන අවස්ථාවලදි ඉල්ලම් තියෙනවානම් එය විනාශ කල යුතු නෑ.නමුත් මේ කිසිවකට මගේ කිසි සම්බන්දයක් නෑ. මට ඕනිත් නෑ.ගලක් මිලදී ගැනිමයි මංකරන්නේ. ඇස්තමේන්තු ප්‍රකාරව පිරිවිතර අනුව අදාල කටයුතු වෙනවානම් එය යි වියයුත්තේ.වැරදි නිවැරදි කරන්න අපිට පුළුවන්. ඒ කටයුතු අපි විතරක් නෙමේ අදාල ආයතන වලටත් කියන්න ඕනි.පසුගියදා කලා වගේ මාධ්‍ය, ජනතා රැල්ල අරන් එන්න පුළුවන්. සභාවෙන් සියල්ලම කල නොහැකියි.නමුත් සභායෙන් කල නොහැකියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

කොන්ක්‍රීට් කරන කෙනාගෙන් මම ඇහුවා .සාමාන්‍යයෙන්.කාපට් උඩින් 4/3ගල් දාල තලනවා. මෙතැන නිකම්ම දානවා.ඒ.බී.සි.දැම්මේ නෑ.පළුදු කලේ නෑ.ගරු රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමා සල්ලි අනුමත කලේ.මෙවැනි කටයුතු නිසා සියල්ලන්ට අපකීර්තියද ඇතිවේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා -</u>

අපි මහජන නියෝජිතයින් උනාට අපිට ඉංජිනේරු දැනුම නෑ.කාර්මික නිලධාරි ඇස්තමේන්තු හදන්නේ. මේ කටයුතු ඇස්තමේන්තුව අනුව සිදු කෙරුනද බලන්න ඕනි. කොන්ත්‍රාත්කරු වැඩ කරන්නේ ඇස්තමේන්තුව අනුව.වරදක් තියේ නම් අදාල ආයතන වලට කතා කරලා අහන්න ඕනි.ඵල රහිතව විවේචනය කරලා වැඩක් නෑ.පලක් තිබිය යුතුයි. අපේ වගකීමක් මේක.වැරදි වෙනවානම් අපි බලමු. කාර්මික නිලධාරි ගෙන්නගෙන බලමු. අපි එකතු වෙලා වැරදි වෙනවා නම් නිවැරදි කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතා.</u>

ගැටළුවක් නෑ.ඔබතුමත් එන්න. අවුරුදු වලින් පස්සේ වැඩ පටන් ගන්නේ.නිසි උපදෙස්අනුව තව දුරටත් නිවැරදි කර ගන්න පුළුවන්. සාකච්ඡා කරලා කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනංජය වීරසේකර මහතා.</u>

එවැනි ගැටළු තියෙනවා.මාර්ග සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කරලා කටයුතු කරන්න අවශ්‍යයි. ඇස්තමේන්තු අනුවළු කටයුතු කරන්නේ.
ප්‍රතිසංස්කරන විතරළු තියෙන්නේ. මේක සොයා බලමු.එදා කනුග්ගල්ල පාර කාපට් කරද්දි වතුර පිටින්ම කරන්න හැදුවේ. මම ඉංජිනේරුට කතා කලා.ටී.ඕ.ට කතා කලා.ටීම් එකක් එව්වා.වේලලා වැඩේ කලා. පොහොරබාව පාර වංචාවක් කලේ.පස්දාලා කලේ.ඒ සමාගමත් අසාදුගත වුනා.මෙ අවස්ථාවේ යම් වරදක් වෙනවා නම් නිවැරදි කරමු.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මාර්ග ගැටළු රැසක්.උප සභාපතිතුමා දැනුම්දුන් පරිදි කනුග්ගල්ල මාර්ග ගැටළුව කාර්මික නිලධාරි මගින් කටයුතු කරමු. පොහොරබාව මාර්ගය අදාල බෝක්කු සම්බන්ධවත් කානි වාර්තා අරගෙන ඉදිරි කටයුතු කරමු.මේ සියළු ගැටළු අදාල අංශ දැනුවත් කර කටයුතු කරමු. මංගල මන්ත්‍රී තුමා ප්‍රකාශ කල ගස් සම්බන්ධව මං කාර්මික නිලධාරි දැනුවත් කලා.නමුත් මේ කොන්ත්‍රාත් එක කරන්නේ කව්ද සොයා ගන්න බෑ. පොලිස් පැමිනිල්ලක් දාමු.හිදැල්ලන ගලුකාගම,මාර්ග කිතුල්පෙ මාර්ග ගැටළු අපි එකතුවෙලා සාකච්ඡා කරලා අදාල අංශ දැනුවත් කරලා විසඳා ගමු. මාර්ග සංවර්ධන අධිකාරියත් සාකච්ඡා වට ගමු.අවුරුදු පසු වෙලා ලේකම්තුමිය සාකච්ඡාවක් කැදවන්න.ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය,අපි එකතු වෙලා දිනයක් යොදාගෙන සාකච්ඡා කරමු. මේ ගැටළු පිලිබඳ තොරතුරු ලබාගන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

ගස් සම්බන්ධ පොලිස් පැමිනිල්ල සම්බන්ධව පැමිනිලි කරන කොට අනවසරයෙන් සිදු කරන කටයුත්තක් බව දැනුම් දෙන්න. එසේම ප්‍රාදේශිය ලේකම්වද දැනුවත් කරන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කාපට් කිරිමට යෝජිත මෙණේරිපිටිය අළුපොත මාර්ගය පුළුල් කිරිම සඳහා දෙපස ඇති ඉවත් කලයුතු ගස් ඉවත්කර සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-03. පුස්සැල්ල නෙළුගොල්ල මාර්ගයේ පස් කඳු කඩාවැටී අවහිර වී ඇති කොටස් පස් ඉවත්කර සැකසීමේ යෝජනාව**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

**පුස්සැල්ල නෙළුගොල්ල මාර්ගයේ පස් කඳු කඩාවැටී අවහිර වී ඇති කොටස් පස් ඉවත්කර සැකසීමට කිරිමට යෝජනා කරමි. මෙය ඉතා දුෂ්කර මාර්ගයක්.ගමනාගමනය අපහසු යි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව පුස්සැල්ල නෙළුගොල්ල මාර්ගයේ පස් කඳු කඩාවැටී අවහිර වී ඇති කොටස් පස් ඉවත්කර සැකසීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**ගරු උප සභාපති  අනිල් ලියනගේ මහතා  විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**05-04.** එල්ලාවල පිටකන්ද දික්හේන ඇල පාණීය ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරිම සම්බන්ධ යෝජනාව

**ගරු උප සභාපති  අනිල් ලියනගේ මහතා**

**පිට කන්ද ගම්මානය ජල ව්‍යාපෘතිය අවුරුදු 20 විතර තිබුනා.දැන් නිසි ලෙස ක්‍රියාත්මක නෑ. එල්ලාවල දික්හේන එකත් නිසි ලෙස ක්‍රියා කරන්නේ නෑ.අපි මේකට මැදිහත්වෙලා නෑ. ඒ අනුව එල්ලාවල පිටකන්ද දික්හේන ඇල පාණීය ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරිම සඳහා සබරගමු පළාත් ගරු ආණ්ඩුකාර තුමා වෙතින්  2022 ප්‍රාදේශිය සංවර්ධන සැලැස්මට මෙම  යෝජනාව ද ඇතුලත් කරන ලෙස  ඉල්ලා සිටිමට  යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -**
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු උප සභාපති  අනිල් ලියනගේ මහතා  විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව  අනුව එල්ලාවල පිටකන්ද දික්හේන ඇල පාණීය ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරිම සඳහා සබරගමු පළාත් ගරු ආණ්ඩුකාර තුමා වෙතින්  2022 ප්‍රාදේශිය සංවර්ධන සැලැස්මට මෙම  යෝජනාව ද ඇතුලත් කරන ලෙස  ඉල්ලා සිටිමට  ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.04.08 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහාසභා වේ තීරන අංක 05-04 උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

එස්.එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

**05-05.** **මැණික්දොල ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සම්බන්ධ යෝජනාව**

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා**

**මෙම යෝජනාව ඉල්ලා අස්කර ගනිමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**05-06.** **වලදූර යහලකොට්ටුන්න මාර්ගයේ බන්ධනාගාර ඉඩම වැට අසලින් යන පාර ජේ.සීබී.යන්ත්‍රයක් දමා කැපීමේ යෝජනාව.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

**වලදූර යහලකොට්ටුන්න මාර්ගයේ බන්ධනාගාර ඉඩම වැට අසලින් යන පාර ජේ.සීබී.යන්ත්‍රයක් දමා කැපීමට යෝජනා කරමි.**

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා**
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව වලදූර යහලකොට්ටුන්න මාර්ගයේ බන්ධනාගාර ඉඩම වැට අසලින් යන පාර ජේ.සීබී.යන්ත්‍රයක් දමා කැපීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-07.** **නඩුකාරදෙනිය සමන්පෙදෙස 4 වන පටු මග අවසන් කොටස  කොන්ක්‍රිට් කිරීමේ යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

**නඩුකාරදෙනිය සමන්පෙදෙස 4 වන පටු මග අවසන් කොටස  කොන්ක්‍රිට් කිරීමට යෝජනා කරමි.**

**<u>ගරු  උප සභාපති  අනිල් ලියනගේ මහතා</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u> <u>විසින්</u> ඉදිරිපත් කරනු ලබන යෝජනාව  අනුව නඩුකාරදෙනිය සමන්පෙදෙස 4 වන පටු මග අවසන් කොටස කොන්ක්‍රිට් කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05- 08 නඩුකාරදෙනිය සමාධි පෙදෙස පහල පාර පොල් කඳවිල වේල්ල හරහා පෙට්ටි බෝක්කුවක් ඉදිකිරිමේ යෝජනාව**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

**නඩුකාරදෙනිය සමාධි පෙදෙස පහල පාර පොල් කඳවිල වේල්ල හරහා පෙට්ටි බෝක්කුවක් ඉදිකිරීමට යෝජනා කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව නඩුකාරදෙනිය සමාධි පෙදෙස පහල පාර පොල් කඳවිල වේල්ල හරහා පෙට්ටි බෝක්කුවක් ඉදිකිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී මානෙල් කරදන මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**05-09. කුරුවිට මිල්ලවිටියේ බී.එල්.බන්දුවර්ධන මාවත කොන්ක්‍රීට් කර බෝක්කු දමා සංවර්ධනය කිරීමේ යෝජනාව**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී මානෙල් කරදන මිය</u>

**කුරුවිට මිල්ලවිටියේ බී.එල්.බන්දුවර්ධන මාවත කොන්ක්‍රීට් කර බෝක්කු දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා</u>

**මෙම කටයුත්ත සඳහා මා විසින් මුදල් වෙන්කලා රේඛීය අමාත්‍යංශය හරහා. සාධ්‍යතා වාර්තා ද සැකසුවා.නමුත් පවතින මූල්‍ය තත්වය අනුව යි ප්‍රමාද උනේ.මෙම කටයුත්ත සිදු කිරිමට නියමිතයි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී මානෙල් කරදන මිය</u>

**එම තත්වය මා දන්නේ නෑ.ජනතා ඉල්ලීමකුයි මා යෝජනා කලේ .එසේ මෙම මාර්ගය හදනවානම් ගැටළුවක් නෑ.යෝජනාව ඉවත් කරන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**ජනතා ඉල්ලීමකට ඉදිරිපත් කර ඇති අතර ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රදේශයේ ජනතා ඉල්ලීම ඉටු කිරිමට කටයුතු ආරම්භ කර ඇති බව දැනුම් දුන්නා.ඒ අනුව ඉදිරි කටයුතු කරමු.**

**යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් යෝජනා.**

<u>2022.04.08 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහාසභා වේ තීරන අංක 05-10 උද්‍ධෘතය</u>.

**05-10. කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් නව වෙළඳ සංකීර්ණයේ අංක 5 කඩ කාමරය නම් සංශෝධනය කිරීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් නව වෙළඳ සංකිර්නයේ අංක 5 කඩ කාමරය බදුකරු වන ලක්සෙවන, බටතොට, කුරුවිට පදිංචි ටි.එම්.සමන්ත බණ්ඩාර ,යන අය විසින් යහල කොට්ටුන්න වලදුර, කුරුවිට පදිංචි අයි.අරුණ කුමාර යන අය වෙත පවරා දීමට කටයුතු කර ඇති බැවින් එම කඩ කාමරයේ බදු අයිතිය අතුරු බදු කරු වෙත පවරා දිමට කටයුතු කරන ලෙස ඉල්ලිම් කර ඇත.එසේම එසේ නම් සංශෝධනයට චක්‍ර ලේඛණ අනුව අවශ්‍ය නීත්‍යානුකූල ලිපි ලේඛණද ඉදිරිපත් කර ඇත. ඒ අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් නව වෙළඳ සංකීර්ණයේ අංක 5 කඩ කාමරය එහි බදුකරු වන ලක්සෙවන, බටතොට, කුරුවිට පදිංචි ටි.එම්.සමන්ත බණ්ඩාර ,යන අය විසින් යහල කොට්ටුන්න වලදුර, කුරුවිට පදිංචි අයි.අරුණ කුමාර යන අය වෙත පවරා දීමට කටයුතු කර ඇති බැවින් එම කඩ කාමරයේ බදු අයිතිය අතුරු බදු කරු වෙත නම් සංශෝධනය කර පවරා දිමට නීත්‍යානුකූලට කටයුතු කිරිමට යෝජනා කරමි.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් නව වෙළඳ සංකීර්ණයේ අංක 5 කඩ කාමරය එහි බදුකරු වන ලක්සෙවන, බටතොට, කුරුවිට පදිංචි ටි.එම්.සමන්ත බණ්ඩාර ,යන අය විසින් යහල කොට්ටුන්න වලදුර, කුරුවිට පදිංචි අයි.අරුණ කුමාර යන අය වෙත පවරා දීමට කටයුතු කර ඇති බැවින් එම කඩ කාමරයේ බදු අයිතිය අතුරු බදු කරු වෙත නම් සංශෝධනය කර පවරා දිමට නීත්‍යානුකූලට කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.04.08 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහාසභා වේ තීරන අංක 05-10 උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

එස්.එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

**05-11.** කුරුවිට ,බෝපත් පෝල්ස් රෙස්ටුරන්ට් ආයතනයේ 1% බදු මුදල අය කිරීම සම්බන්ධ යෝජනාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

කුරුවිට ,බෝපත් පෝල්ස් රෙස්ටුරන්ට් ආයතනයේ 1% බදු මුදල අය කිරීම සම්බන්ධ ව එල්.ඊ.ලියනගේ මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත.2019 වර්ෂයේ රටේ සිදුවූ තත්වය මත සංචාරක කර්මාන්තයේ ඇද වැටීමත් සමග හෝටලයේ අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීම නිසා ආයතනය වසා ඇති අතර සාමාන්‍ය පරිදි ව්‍යාපාරික කටයුතු සිදු නොවන බවත් දන්වා ඇත. බෝපත් පෝල්ස් රෙස්ටුරන්ට් ආයතනයේ හිමිකරු එල්.ඊ.ලියනගේ මහතා විසින් තත්වය සලකා බලා සහනයක් දෙන ලෙස ඉල්ලීම් කර ඇත.
මේ සම්බන්ධයෙන් ආදායම් පරික්ෂක වරුන්ද වාර්තාවක් ලබා දී ඇත. 2019 සිට හෝටලය වසා ඇති බව වාර්තාවේ.2018 වර්ෂයේ 1% බදු මුදල අය කරගත යුතු වේ.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

ආදායම් පරිපාලක වාර්තා ඇත්නම් මෙම කටයුත්ත සිදු කල හැක.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මෙම ආයතනය වසා තිබුණ කාරනය අපි දැනුවත්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

නීත්‍යානුකූලව ව්‍යාපාරය ක්‍රියාත්මක නොවේ නම් ග්‍රාම සේවා නිලධාරි සහතික කොට සභාවට ලිපියක් ඉදිරිපත් කල යුතුයි. කලින් දැනුම්දෙන්න ඕනි.ක්‍රමවේදයක් නැතිව බැ.ක්‍රමානුකූලව සිදු නොවූ ආදායම් කපා හැරීමකට මා විරුද්ධතාවය ප්‍රකාශ කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

2019 බෝම්බ සිද්ධීන් සමග සංචාරක කර්මාන්ත, ව්‍යාපාර අසාර්ථක වුනා.2020,2021 කාලවල කොවිඩ් හා අළුත්වැඩියා කටයුතු සඳහා මේ ආයතනය වසා තබලා. අපි බෝපත් ඇල්ලට යාමත් තහනම් කලා.මේ ව්‍යාපාර කටයුතු සිදු වුනේ නැ.2018 වර්ෂයට අය කරන්න ඕනි.ග්‍රාම නිලදාරි වාර්තා අරන් මේ කාරණය සත්‍යතාවය තහවුරු කර කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-

කොමසාරිස්ට තොරතුරු අරින්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

ඒ වර්ෂවල ආදායම කොපමනද?අපි බිල් කරන්න ඕනි.ලිපි යොමු කරල සන්නිවේදනය තියා ගත යුතුයි.මේ ව්‍යාපාර වහපු කාල සීමාවක් තිබුණා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

ඒ වර්ෂවල අදායමක් නැළු.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මම කැමතියි.සභාවට යම් ආදායමක් ගන්න.නමුත් මේ කොරෝනා සමයේ ව්‍යාපාර වසා දමා තිබු කාලවලත් අයකිරිම අසාධාරනයි.ග්‍රාමනිලධාරි වාර්තා අරන් සත්‍ය ලෙස ව්‍යාපාර වසා තිබුනේ නම් ලබන සභාවට ඉදිරිපත් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ජයරත්න මහතා :-

ඒ තොරතුරු පළාත් පාලන කොමසාරිස්ට අරින්න.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

කොවිඩ් කාලේ සහන ලබාදිමට පොදු තීරන ගන්තා.ඒ තීන්දුව පොදුයි.එය ප්‍රමානවත් නොවේනම් මේ සියළු දේ ආවරනය වන පරිදි පොදු තීන්දුවක් ගන්න.නමුත් එය ක්‍රියාත්මකවීමේදි සාධක ඕනි.ග්‍රාම නිලධාරී වාර්තා, ආදායම් පරිපාලක වාර්තා අවශ්‍යයි.මේ අර්බුධ සමයේ සභාවට එන ආදායමක් මගහැරිය යුතු නැ.සභා ආදායම් ඉහල යා යුතුයි.නිලධාරි ඒ සම්බන්ධ අවධානය යොමු කරන්න.නීත්‍යානු කූල ලැබීම් අය කරගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා :-

ගැටළුවක්.හෝටල් වලින් 1% ට ගැනීමට බදු මුදල ගනනය කරන ක්‍රම වේදයක් අනුව බිල් සීල් කරනවද? මේ හෝටලේ සීල් කරලද? නිතර ආයතන වෙනුවෙන් කතා කරනවා.රටේ දුප්පත් මිනිසුන් වෙනුවෙන් කව්ද කතා කරන්නේ.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

සංචාරක මණ්ඩලය අනුමත ඒවට විතරක් අවසාන ලාභාංෂ වාර්තාව අනුව සියයට එකක්. වරලත් ගණකාධිකාරි සහතික කල වාර්තාවක් අනුව .මේ හෝටල් බදු පිලිබඳ කතාවක් වන අතර වෙනත් මාතෘකා කතා කල නොහැක.

ඒ අනුව කුරුවිට ,බෝපත් පෝල්ස් රෙස්ටුරන්ට් ආයතනයේ 1% බදු මුදල අය කිරීම සම්බන්ධයෙන් 2018 වර්ෂයට 1% බදු මුදල නිසි පරිදි අය කර ගැනිමටත් 2019,2020.2021,යන වර්ෂයන් තුල රටේ තිබු සංචාරක කටයුතු බිඳවැටිම හා කොවිඩ් හේතුවෙන් මෙම ආයතනය වසා තිබුනේද යන්න ග්‍රාම නිලධාරි වාර්තා ලබාගෙන තහවුරු කොටගෙන කපා හැරීම් සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන සහනය ලබාදීමට නීත්‍යානුකූලව කටයුතු කිරිමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව හා බෝපත් පෝල්ස් රෙස්ටුරන්ට් ආයතනයේ හිමිකරු එල්.ර්.ලියනගේ මහතාගේ ඉල්ලීම අනුව කුරුවිට ,බෝපත් පෝල්ස් රෙස්ටුරන්ට් ආයතනයේ 1% බදු මුදල අය කිරීම සම්බන්ධයෙන් 2018 වර්ෂයට 1% බදු මුදල නිසි පරිදි අය කර ගැනිමටත් 2019,2020.2021,යන වර්ෂයන් තුල රටේ තිබු සංචාරක කටයුතු බිඳවැටිම හා කොවිඩ් හේතුවෙන් මෙම ආයතනය වසා තිබුනේද යන්න ග්‍රාම නිලධාරි වාර්තා ලබාගෙන තහවුරු කොටගෙන කපා හැරීම් සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන සහනය ලබාදීමට නීත්‍යානුකූලට කටයුතු කිරිමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

2022.04.08 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහාසභා වේ තීරන අංක 05-04 උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

එස්.එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

**05-12.** **නාගරික සංවර්ධන ප්‍රදේශයන් වශයෙන් නම් කරන ලද ප්‍රදේශ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් නිකුත්කර ඇති සැලසුම් හා සංවර්ධන නියෝග 1 රෙගුලාසින් නාගරික නොවන, විශේෂිත ප්‍රදේශ සඳහා ද ක්‍රියාත්මක කිරීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**නාගරික සංවර්ධන ප්‍රදේශයන් වශයෙන් නම් කරන ලද ප්‍රදේශ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් නිකුත්කර ඇති සැලසුම් හා සංවර්ධන නියෝග 1 රෙගුලාසින් නාගරික නොවන, විශේෂිත ප්‍රදේශ සඳහා ද ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>

**අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කරන්න.බස්නාහිර පළාතේ එක වැළඳ ගත්තා.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**මේ සම්බන්ධ තොරතුරු දෙන්න.ලබන සභාවට මේ සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කරන්න. නාගරික සංවර්ධන ප්‍රදේශයන් වශයෙන් නම් කරන ලද ප්‍රදේශ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් නිකුත්කර ඇති සැලසුම් හා සංවර්ධන නියෝග 1 රෙගුලාසින් නාගරික නොවන, විශේෂිත ප්‍රදේශ සඳහා ද ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ව අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කිරිමට යෝජනා කරමි. තොරතුරු සභාවට ඉදිරිපත් කරන්න.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව නාගරික සංවර්ධන ප්‍රදේශයන් වශයෙන් නම් කරන ලද ප්‍රදේශ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් නිකුත්කර ඇති සැලසුම් හා සංවර්ධන නියෝග 1 රෙගුලාසින් නාගරික නොවන, විශේෂිත ප්‍රදේශ සඳහා ද ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කිරිමට ත් තොරතුරු මහා සභාවට ඉදිරිපත් කිරිමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-13. තෙප්පනාව, කළු කැලේ ජනතාව වෙත පාණිය ජල අවශ්‍යතාවය සඳහා නල ලිඳක් ලබා දිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**තෙප්පනාව ,කළු කැලේ පදිංචි ගම්වාසින් විසින් නල ලිඳක් ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත.ඒ අනුව බිමට ජලය ලබාගැනීම ඇඩි දුෂ්කර බවත් කඳුකර ප්‍රෙදේශයක් බවත් සඳහන් කර වයි.ප්‍රියන්ත වීරසිංහ ඇතුළු පවුල් 6ක සාමාජිකයන් විසින් අත්සනින් යුතුව ඉල්ලීම් කර ඇත.ඒ අනුව තෙප්පනාව ,කළු කැලේ පදිංචි ගම්වාසින් විසින් නල ලිඳක් ලබාදෙන ලෙස සිදු කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තා සහ අවශ්‍ය අනෙකුත් නීත්‍යානුකූල වාර්තා ලබාගෙන නල ලිඳක් ඉදිකිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන විජේසිරි මහතා :-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා තෙප්පනාව ,කළු කැලේ පදිංචි ගම්වාසින් විසින් නල ළිඳක් ලබාදෙන ලෙස සිදු කර ඇති ඉල්ලීම අනුව කාර්මික නිලධාරි වාර්තා සහ අවශ්‍ය අනෙකුත් නීත්‍යානුකූල වාර්තා ලබාගෙන නල ළිඳක් ඉදිකිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxx**

**05-14.** **උතුරු එක්නැලිගොඩ ග්‍රාම නිලධාරි වසමේ ගංවතුර ආපදාවට ලක්වන, එරත්නගොඩ ගම්මානයේ ජනතාවට ගමනාගමන හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා ඔරුවක් ලබා දීම සම්බන්ධ යෝජනාව**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**උතුරු එක්නැලිගොඩ ග්‍රාම නිලධාරි වසමේ ගංවතුර ආපදාවට ලක්වන, එරත්නගොඩ ගම්මානයේ ජනතාවට ගමනාගමන හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා ඔරුවක් ලබා දෙන ලෙස ගැමුණු ගොවි සංවිධානයේ ලේකම් මගින් ඉල්ලීමක් කර ඇත.ඒ අනුව එරත්නගොඩ ගමේ නිවාස 15 පමන නිරතුරුවම ගංවතුරින් පීඩාවට පත්වන බවත් ඔරුවක අවශ්‍යතාවය දැඩිව පවතින බවත් සඳහන් කර ඇත. ඒ අනුව උතුරු එක්නැලිගොඩ ග්‍රාම නිලධාරි වසමේ ගංවතුර ආපදාවට ලක්වන, එරත්නගොඩ ගම්මානයේ ජනතාවට ගමනාගමන හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා ඔරුවක් ලබා දීමටනීත්‍යානුකූලව කටයුතු කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේ කුමාර මහතා :-</u>

<u>එ</u>ම යෝජනාව ස්ථිර කරමි.

**මුලින්ම ගංවතුර එන්නේ එම ප්‍රෙද්ශයට. සභාවේ ඇති ඔරු කඳක් හෝ දෙන්න.ජනතාව දැඩි දුෂ්කරතාවයකට පත්වෙන්නේ.මේ පීඩාව ඉවත්කිරිම ඉතා වැදගත්.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව හා උතුරු එක්නැලිගොඩ ගැමුණු ගොවි සංවිධානයේ ලේකම් මගින් සිදු කර ඇති ඉල්ලීම අනුව උතුරු එක්නැලිගොඩ ග්‍රාම නිලධාරි වසමේ ගංවතුර ආපදාවට ලක්වන, එරත්නගොඩ ගම්මානයේ ජනතාවට ගමනාගමන හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා ඔරුවක් ලබා දීමට නීත්‍යානුකූලව කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxx**

05-15. කුරුවිට ප්‍රාදේශීය සභාවේ **2022 වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2022 ප්‍රසම්පාදන සැලැස්ම සඳහා මහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය :-**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2022 ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-16.** **කිරිඇල්ල ප්‍රාදේශිය සභා පොදු වෙළඳපල අසල බහු කාර්ය විදුලි පහන් කණුවක් ස්ථාපිත කිරීම පිළිබඳව ලැබී ඇති අනුමැතිය සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කිරිඇල්ල ප්‍රාදේශිය සභා පොදු වෙළඳපල අසල බහු කාර්ය විදුලි පහන් කණුවක් ස්ථාපිත කිරීම සඳහා 2020.02.14 දින පැවති මහා සභාවේදි අංක 07-29 සභා තීරනය අනුව විදුලි සංදේශය නියාමන කොමිෂන් සබාවේ එකගතාවය ලබාදුන් පසුව නිත්‍යානුකූලව කටයුතු කිරිමට සභා සම්මත විය. මේ වන විට විදුලි සංදේශ කොමිෂන් සභාවේ අනුමැතිය එකගතාවය ලැබී ඇත. ඒ අනුව කිරිඇල්ල ප්‍රාදේශිය සභා පොදු වෙළඳපල අසල බහු කාර්ය විදුලි පහන් කණුවක් ස්ථාපිත කිරීම පිළිබඳව ලැබී ඇති විදුලි සංදේශ කොමිෂන් සභාවේ අනුමැතිය අනුව නීත්‍යානුකූල ඉදිරි කටයුතු කිරිමට යෝජනා කරමි.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

**මිට පෙර මේ සභා යෝජනාව ගෙනාවා.කණු දෙකක් සම්බන්ධව .මම මේ සදහා විරුද්ධ වුනා.අනිත් අය එකඟ උනා.නඩුකාරදෙනිය හන්දියේ දාලා.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**සභාව උනත් අනුමැතිය ගන්න ඕනි ඒ අවශ්‍ය ආයතන, නිලධාරින්ගෙන්.අපිට ගැටළුවක් නැත්නම් අපි ගැටළු නැති බව දැනුම් දෙනවා.නමුත් කණුව හදනවට වෙනම අනුමැතිය ගන්න ඕනි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

**සභාවට ආදායම් ලෙස ලැබෙන මුදල කොපමනද?**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**උස අනුව අය කරන ගෙවිම් ක්‍රමවේදයක් ඇත.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජන් ප්‍රදීප් මහතා :-

**මෙය විදුලි පහන් කණුවක් නොවේ.මෙම කුළුන කුමක්ද? ඒ ආයතනය සමග සාකච්ඡා කිරිමේ දිත් අමුතු ආකාරයේ උත්තර ලබා දුනි.එකගතාවකට එන්න බැරි උනා.වචන හුවමාරු උනා.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**ඒ මලව කුළුන සම්බන්ධව වේ.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

අපි සාමාන්‍යයෙන් යම් යම් දේට විරුද්ධ වෙනවා.නමුත් මාස 3 කට පමන පෙර අපි වැඩමුළුවකටගියා. ඔන්ලයින් පිලිබද.එය ඉම්පැක් ටෙක්.තිබුනේ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රන ශාලාවේ.මේ වෙනකොට එරත්න 16 ස්ථානයකට ඉල්ලලා. පලාත් පාලන ආයතන වලින් අනුමැතිය ඕනි.දූර්වලම ඉඹුල්පේ.අනුමැතිය ලැබිලා නෑ.සන්නිවේදනය අත්‍යවශය වෙලා.තාක්ෂනය ඕනි. මේවා සවි කරන පිලිවෙලක් තියෙනවා.ඒ නියමිත ක්‍රම වේදයට මේ කටයුත්තට ඉඩ දෙන්න.අපිට තාක්ෂණය අධික්ෂනය කරන්න බෑ. නමුත් යුතුකම තාක්ෂනය සමාජයට දිම.පුද්ගලික ආයතන තියෙනවා.ටෙලිකොම්, තියෙනවා.කෙසේ හෝ අපේ ක්‍රියාදාමය විය යුත්තේ ක්‍රමවේදයකට අනුව මෙය සිදු කිරිමයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

කිරිඇල්ල ප්‍රාදේශිය සභා පොදු වෙළඳපල අසල .මෙහි මුදල කීයද? රු.20000.00 පමන වනු ඇත.බදු කරය කෙසේද?මා තාක්ෂනය අවශ්‍ය බවට එකඟයි.නමුත් මේ සම්බන්ධව මා නිදහස් කරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මේ කටයුත්ත සම්බන්ධව වාර්තාවක් ලබන සභාවට ඉදිරිපත් කල හැක.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

භූමියට ලබාගන්නා බද්ද සභාව තීරනය කල යුතු වේ.ගිවිසුම් ගතව නිසි පරිදි බිම්බදු ගත යුතුය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-

නිශ්චිතව මෙම කුළුන කුමක්ද?විශාල කණු.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
මෙය රටේ පවතින ව්‍යාපෘතිවේ.මේ සභාවට පමනක් විශේෂිත දෙයක් නොවේ.මේවා රටේ අවශ්‍යතාවේ.යම් හානියක් ජනතාවට වේනම් විරුද්ධ වන අතර එවැනි අවස්ථා ඇත.නමුත් මෙවැනි කටයුතු වලදී ලෝකය සමග අපද ඉදිරියට යායුතුය.සියළු දේට විරුද්ධ විම සුදුසු නැත.තමන් දැනුවත් නෑ කියලා විරුද්ධ වෙන්න බෑ. එය පදනම් විරහිත විරුද්ධ වීමක්. සාධාරන හේතු තිබිය යුතුය. එසේම යම් අයදුම්පතක් ඉදිරිපත්වුවිට එය ආයතනයකින් පිලිනොගෙන

සිටිය නොහැක.ප්‍රතික්ෂේප කිරිමට කරුනු තිබිය යුතුයි. අදාල ආයතන සමග උපදෙස් මත ක්‍රියාත්මක වු කටයුත්තක් වන අතර මෙය අළුත් කුළුනක් නොවේ.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කිරිඇල්ල ප්‍රාදේශිය සභා පොදු වෙළඳපල අසල බහු කාර්ය විදුලි පහන් කණුවක් ස්ථාපිත කිරීම පිළිබඳව ලැබී ඇති විදුලි සංදේශ කොමිෂන් සභාවේ අනුමැතිය අනුව නීත්‍යානුකූල ව ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.04.08 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහාසභා වේ තීරන අංක 05-17 උද්ධෘතය.

**05-17.** **කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ අවශ්‍යතා සඳහා 150 වොට් ලෙඩ් වීදි පහන් මිලදී ගැනීම සම්බන්ධ යෝජනාව.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**මෙය මීට කලින් ද සිදුකරන ලද යෝජනාවක්. ගරු මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම් මත. මෙම වීදි පහන් මිලදි ගැනිමට මිල ගනන් කැඳවලා තියෙනවා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-**
**මේ දිනවල රටේ පවතින තත්වය අනුව විදිපහන් දැල්වීමත් සීමා කරන්න වෙලා.රටම විදුලි අර්බුධයක.මේ වෙලාවේ දාලා තියෙන විදුලි පහනුත් නිවන්න වෙලා.ඒකයි යථාර්ථය. මෙම විදුලිපහන් සම්බන්ධ කටයුත්තට මං විරුද්ධයි. මගේ විරෝධය පලකරනවා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි නයනා ජීවනි මිය.**

**විරෝධතාවය පල කරමි.ජනතා මුදල්.භාවිතා කිරීමෙදි අරපරිස්සම් වෙන්න.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**එම විරෝධතා සටහන් කරන්න.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා :-**

**මන්ත්‍රි වරුන්ගේ ප්‍රතිපාදන මත ඉල්ලු ඒවා.අවශ්‍ය නැති අයට අවශ්‍ය නෑ.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි දයා කස්තුරි මිය.**

**අපිට වීදිපහන් අවශ්‍යයි.ජනතාව ඉල්ලු පරිදි අපි ලබාදෙන බවට ප්‍රකාශ කල වීදිපහන් අවශ්‍යයි.**

**උප සභාපති අනිල් ලියනගේ මහතා -**
**මේ යෝජනා කලින් කලට එනවා.හික්මීමක් ඕනි.එසේම ප්‍රමුණතාවක් අනුව කටයුතු කල යුතුයි.සමහර යෝජනා කල යුතුමයි.හෙට ගංවතුර නම් අපි ඒ සදහා ප්‍රමුඛත්වය දිය යුතුයි.**

මේ වසරේ වීදිපහන් වලට මුදලක් වෙන් කරලා.මන්ත්‍රී ප්‍රතිපාදන.වෙනස් කල හැක්කේ මේ සභාවට .ගෙනත් නෑ.ප්‍රමුඛතා දිය යුතු වෙනවා. මේවා ජනතා ව වෙනුවෙන් ඉල්ලීම්.මාත් ඉල්ලුවා. දැනට මිලදී නොගෙන පසුව බලා කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-

විදුලිය කප්පාදුවක් පවතින මේ කාලයේ.මැයි,ජූනි,ජූලි වන විට හරියයි.වැරදි ආදර්ශ දෙන්න එපා.පැය 24 විදුලිය සැපයුම දිය හැකි ලෙස තත්වය පත්වුනාට පසු ගමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි මාලනී පිරිස් මිය.

මිනිස්සුන්ගේ ප්‍රමුඛ ඉල්ලීමක් මේ.ජනතාවට මේ අඳුරු මාර්ග ආලෝක කර දීම හරිම වැදගත්.ගාමන්ට් සේවිකාවන් මේ වන විට දැඩි දුෂ්කරතාවයෙන් පාරේ යන්නේ. අඳුර නිසා.අපි මේ විදුලි අර්බුධ කාලේ සවි කලත් විදුලිය විසන්ධි කරන නිසා වැඩි පාඩුවක් නෑ. ජනතා ඉල්ලීම ඉටු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා :-

විපක්ෂ මන්ත්‍රිවරු වාර ගනනනක් ඉල්ලුවා විදි ලාම්පු.ඒ සියල්ල ප්‍රතික්ෂේප වුනා.මම අවස්ථා කීපයක ලයිට් කීපයක් දැම්මා.විපක්ෂයට මන්ත්‍රිලට ඡන්දය දුන් මිනුස්සුත් පාරේ යනවා.ගාමන්ට් යනවා.නමුත් මගේ තරහක් නෑ.අතේ මුදලිනුත් ගත්තා.දුන්න ලයිට් වලට ස්තුති.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

සමහර තැන් වල දැඩි අවශ්‍යතා ඉල්ලීම් තියෙනවා.අපි සෙන්සර් බල්බ් උපකරන අක්‍රිය නිසා ස්විච් වලට ගියා.සමහරු නිවන්න කීවට නිවන්නෑ.ගෙවල් වලට ලඟ ඒවා සමහරු නිවනවා.සමහර ඒවා උදේටවත් අක්‍රිය කරන්නෑ. නැවතත් සුදුසු තාක්ෂනයයක් බලන්න.වලඳුරට සෝලා එලිය ඇති.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මේ මිල ගනන් කැඳවා ඇත්තේ මන්ත්‍රි ඉල්ලිම් අනුවයි.විදි ලාම්පු සවි කරන අවස්ථාව මෙය නොවේ.නමුත් අවශ්‍ය නැත්නම් නොගෙන ඉමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-

මේ වන විට පවතින තත්වය අනුව අද ලැබී ඇති මිල ගනනට හෙට මිලදි ගත නොහැකියි.

ලබන මාසය වන විට මේ මිල ගනන් ඉතා ඉහල අගයක් ගනී.රු. 13000.00 රු.22000.00 පමන වේවි.නියම තත්වය එයයි. නමුත් මේ අවස්ථාවේ සවි කිරීම සුදුසු නෑ.

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

මේ මිල ගනන් ඉහල යාම අනිවාර්ය දෙයක්.මේ විදිපහන් නිත්‍යානුකූලව මිලදි අරන් පසුව සවි කරමු.විදුලි අර්බුධය විසදුන පසුව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී   ආර්.සෝමරත්න මහතා :-

ජාතික අවශ්‍යතා වලට මුල් තැන දෙන්න.අපි විදි පහන් වලට වඩා දෙයක් කරමු.

මිලදීගන්න එපා.සභා නිල කාලය දිර්ග නෑ.අපිට අවශ්‍ය නෑ.ජනතාව වෙනුවෙන් ඒ අවශ්‍යතා වලට මුල්තැන දෙන්න.තීරන දුර දිග බලා ගන්න.මේ අවස්ථාවේ ජාතික විදුලි බල පද්ධතියටම ප්‍රශ්න. දේශපාලනය ඇතත් නැතත් අවස්ථාවාදී දේශපාලනය හෙලා දකිනවා.හෘර්ධ සාක්ෂියට එකඟව කටයුතු කරන්න. නැවත දේශපාලනය කලත් නැතත් එකයි.ඉල්ලා අස්විමට වුවත් සුදානම්.මේ අවස්ථාවේ විදිලාම්පු අත්‍යවශ්‍යනෑ.විරෝධය දක්වනවා.

මේ අවස්ථාවේ සභාවේ දැඩි ගෝෂාපැවතිණි.

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා
මේ යෝජනාව අනුව මිල ගනන් කැදෙව්වේ  මන්ත්‍රිවරු 25 කගේ ඉල්ලීම් මත.ඒ අයට අවශ්‍ය නැත්නම් කියන්න.බහුතර මතය එපානම් එපා.ගැටළුවක්.25 ක් ඉල්ලා තියෙනවා.දැන් එපාලු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී   කැළුම් ශ්‍රී ධර්මදාස මහතා :-

මාත් ඉල්ලුවා.මේ වෙලාවේ විදුලි අර්බුධ බව ඇත්ත.නමුත් මේ අර්බුධය විසදෙන්න අවශ්‍යයි. ජනතා අවශ්‍යතාවත් තියෙනවා. මිල ගනන් ඉහලත් යයි.මේ විදි පහන් දෙන්න.

සභාවේ ගෝෂා..

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

එකඟයි.මිල ගනන් ඉහල යයි.විදුලි ගැටළු නිමවූවිට පැය 24 විදුලිය සැපයීමට හැකි වුවිට  සවි කල හැකියි.
ඒ අනුව කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ  අවශ්‍යතා සඳහා  150 වොට් LED  වීදි පහන් මිලදී ගැනීමට  කැඳවන ලද මහා සභාවට ඉදිරිපත්කල  මිල ගනන් පහත පරිදිවේ.
අවම මිල යටතේ ගමු.

| ආයතනය | විස්තරය | **එකක මිළ** | පමාණය | මුළ මුදල |
|---|---|---|---|---|
| | **150W LED street light** | **17500.00** | **325** | **5687500.00** |

| | | | | |
|---|---|---|---|---|
| e –lighting (pvt) ltd,No100, First cross street, Colombo 11 | Bend pipe clamp(Gi) nut | 5000.00 | 325 | 1625000.00 |
| Daya electricals 79, First cross street, Colombo 11 | DECO 6708-150W Brand-decolight | 21000.00 | 325 | 6825000.00 |
| D and D Electrical and Engineering,223/1, Makewita, ja-Ela | 150W LED street lamp | 16700.00 | 325 | 5427500.00 |
| | Bend pipe clamp(Gi) nut | 3900.00 | 325 | 1267500.00 |
| As RENISH (pvt) 70/A, First cross street, Colombo 11 | 150W LED street lamp | 18000.00 | 325 | 5850000.00 |
| | Bend pipe clamp(Gi) nut | 5300.00 | 325 | 1722500.00 |
| GLOBAL ELECTIC AND LIGHTING SOLUTION First cross street, Colombo 11 | 150W LED street lamp | 18500.00 | 325 | 6012500.00 |
| | Bend pipe clamp(Gi) nut | 4900.00 | 325 | 1592500.00 |
| Rodrigo Multi supplys,NO 223/A, Makewita, Ja-Ela | 150W LED street lamp | 20000.00 | 325 | 6500000.00 |
| | Bend pipe clamp(Gi) nut | 4700.00 | 325 | 1527500.00 |

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

ඉහත පරිදි මහජන ඉල්ලීම් හා මහජන නියෝජිත ඉල්ලිම්, කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ අවශ්‍යතා සඳහා 150 වොට් LED වීදි පහන් මිලදී ගැනීමට කැඳවන ලද මිල ගනන් යටතේ අඩුම මිලගණන් ඉදිරිපත් කර ඇතිD and D Electrical and Engineering,223/1, Makewita, ja-Ela ආයතනය වෙතින් 150W LED STREET LAMP COMPLET SET 325 ක් මිළදි ගැනීමටත් ඒ සඳහා 6695000.00ක මුදලක් ගෙවීම් කිරීමටත් යෝජනා කරමි.

**සභාවේ ගෝෂා........**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි  දයා කස්තුරි මිය.</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවශ්‍යතා සඳහා 150 වොට් LED වීදි පහන් මිලදී ගැනීමට කැඳවන ලද මිල ගනන් යටතේ අඩුම මිලගණන් ඉදිරිපත් කර ඇතිD and D Electrical and Engineering,223/1, Makewita, ja-Ela ආයතනය වෙතින් 150W LED STREET LAMP COMPLET SET 325 ක් මිළදි ගැනීමටත් ඒ සඳහා 6695000.00ක මුදලක් ගෙවීම් කිරීමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-18. පහල තලාවිටිය ගම්වාසීන් විසින් වරිපනම් විරෝධතාවක් සම්බන්ධව ඉදිරිපත් කර ඇති මහජන පැමිනිල්ල පිලිබදව ඉදිරි කටයුතු සදහා වන යෝජනාව**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මෙම කාරණය සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් දැනුම් දීමක් සිදු කර ඇති අතර ඒ අනුව මීට පෙර ද පහල තලාවිටිය ගම් වාසින් මුහුන දී ඇති ගැටළු සම්බන්ධව එම ගම්වාසින් සමග සාකච්ඡා වක් පවත්වා එහි ප්‍රගතිය දන්වා එවන ලෙස සභාවට දැනුම් දී ඇතත් සිදු නොවූ බවත් එකම ගැටළුව නැවත නැවත එම ගම්වාසින් විසින් තමා වෙත යොමු කරන බැවින් කඩිනමින් විසඳීමට පියවර ගන්නා ලෙස නැවතත් දැනුම් දී ඇත .ඒ අනුව ඩී.වී.මහේෂ් කුමාර මයා,තලාවිටිය,පරකඩුව විසින් යොමු කර ඇති මෙම ලිපිය අනුව 1998 වර්ෂයේ සිටම ගම් වාසින් විසින් වරිපනම් විරෝධතාවන් පිළිබඳව දන්වා සිටිය ද මෙතෙක් විසඳුම් නොලැබුන බව සඳහන් කර ඇත .එසේම වරිපනම් සීමාවන් තුළින් එම ප්‍රදේශය ඉවත් කර දෙන ලෙසත් පහල තලාවිටිය ප්‍රදේශය සංවර්ධන වූ ප්‍රදේශයක් ලෙස ගැසට් වී නොමැති බවත් ඒ නිසා මෙම කටයුත්ත සිදු කරන මෙන් ද පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත දැනුම් දී ඇත. එසේම එය කළ නොහැකි නම් විකල්ප යෝජනා කිහිපයක් ද ඉදිරිපත් කර ඇත. ඒ අනුව මේ සම්බන්ධව තීරණයක් ගත යුතුව වේ. මෙම ප්‍රදේශය දියුණු ගම් ප්‍රදේශයක් වන අතර පළාත් පාලන ආයතනයක් ලෙස සිදුවිය යුතු සේවාවන් වන කැලි කසළ ඉවත් කිරීමේ කටයුතු , අවශ්‍ය ස්ථානවලට විදී පහන් සවි කිරීම, මාර්ග සංවර්ධනය ආදී සේවාවන් සපයා ඇත.එසේම වරිපනම් ලෙස අයකරනු ලබන්නේ සුළු මුදලක් වන අතර එසේ අය කරනු ලබන මුදලින් සංවර්ධනය කරනුයේ වරිපනම් ප්‍රදේශ පමනත් නොවේ. නොදියුණු ප්‍රදේශ ද සංවර්ධනය කරනුයේ මෙම මුදලිනි.ඒ අනුව සභාවේ ආදයමක් ලෙස වරිපනම් වැදගත් වේ . වරිපනම් ඉවත් කළ හොත් ලැබෙන සුළු ආදයම ද සභාවට අහිමි වේ. සංවර්ධන කටයුතු හැකියාව අඩුවේ. සියළු කරුනු සලකා බලා දියුණු ගම් ප්‍රදේශයක් වන මෙම පහල තලාවිටිය ප්‍රදේශයේ වරිපනම් ඉවත් කිරිම සඳහා අනුමැතියක් ලබා නොදීමටත් මෙම පැමිණිල්ල පිළිබඳ පරික්ෂණයක් පවත්වා වාර්තාවක් පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කිරිමටත් යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා.</u>

එම යෝජනාව ස්ථිර කරමි. වරිපනම් ගැසට් කළ පසු අවලංගු කිරීමට අපට බලයක් නැත. එසේම එය එක් අයෙකු වෙනුවෙන් කළ නොහැකියි. මේ වරිපනම් එල්ලාවල ගම් සහා කාලේ ඒවා. මේවා දියුණු ගම් ප්‍රදේශ . මේ සම්බන්ධයෙන් සියළු තොරතුරු සහිතව අර්ථකථනය කරලා දැනුවත් ලිපියක් යොමු කරන්න .එසේම මෙවැනි ඉල්ලීම් මත වරිපනම් ඉවත් කිරීම වරිපනම් ගෙවන නීති ගරුක පුරවැසියන්ට කරන අසාධාරනයක් වේ.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා පහල තලාවිටිය ගම් වාසින් විසින් වරිපනම් විරෝධතාවක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති මහජන පැමිණිල්ල අනුව දියුණු ගම් ප්‍රදේශයක් වන මෙම පහල තලාවිටිය ප්‍රදේශයේ වරිපනම් ඉවත් කිරීම සඳහා අනුමැතියක් ලබා නොදීමටත් මෙම පැමිණිල්ල පිළිබඳ පරීක්ෂණයක් පවත්වා වාර්ථාවක් පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කිරිමටත් ඒකමතිව සභා සම්මත විය. Xxxxxxxxxxxxxxxxxxx**

2022.04.08 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහාසභා වේ තීරන අංක 05-04 උදෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

එස්.එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

**05-19.** **කඳන්ගොඩ, කුරුවිට පදිංචි එම්.පී.අම්පාගල මයා, විසින් ඉදිරිපත්කර ඇති අයකරගැනිමට අදාල වරිපනම් අංක 254 සම්බන්ධ ගැටළුව පිළිබඳ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**මෙම වරිපනම් ගැටළුව සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් මෙම සභාව දැනුවත් කර ඇති අතර එම්.පී. අම්පාගල මයා විසින් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කර ඇති ලිපියේ පිටපතක් ද සබාව වෙත යොමු කර ඇත.මීට ඉහතදිද මෙම ගැටළුව පිලිබඳ සභාව වෙත දැනුම් දී ඇති බවද සඳහන් කර ඇති අතර එම අම්පාගල මයාගේ ලිපිය අනුව තක්සේරු විරෝධතා තමන් විසින් සභාව වෙත දන්වා ඇති අතර තමාගේ පදිංචිය දියුණු ගම් ප්‍රෙද්ශය තුල පිහිටා නොමැති බවත් කසල බැහැරකිරීම , ජලය, වීදි පහන් නොමැතිකම මාර්ග නඩත්තුව නොමැති කම,ආදී ගැටළු විසඳි නොමැති බවත් සඳහන් කර ඇත.තවද එම සේවාවන් ලබාදි වරිපනම් අය කරන ලෙස සඳහන් කර ඇත. ඒ අනුව කඳන්ගොඩ, කුරුවිට පදිංචි එම්.පී.අම්පාගල මයා, විසින් ඉදිරිපත්කර ඇති අයකරගැනිමට අදාල වරිපනම් අංක 254 සම්බන්ධ ගැටළුව පිලිබඳව පරීක්ෂනයක් සිදුකර වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු කිරිමටත් ඒ සම්බන්ධ වාර්තාවක් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කිරිමටත් යෝජනා කරමි.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා කඳන්ගොඩ, කුරුවිට පදිංචි එම්.පී.අම්පාගල මයා, විසින් ඉදිරිපත්කර ඇති අයකරගැනිමට අදාල වරිපනම් අංක 254 සම්බන්ධ ගැටළුව පිලිබඳ ලිපිය අනුව පරීක්ෂනයක් සිදුකර වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු කිරිමටත් ඒ සම්බන්ධ වාර්තාවක් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කිරිමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-20.** **කුරුවිට ප්‍රාදේශිය සභාවේ එල්ලාවල උපකාර්යාලය අසල ගිමන්හල ඉදිරිපිට කාණුව සැකසීම හා මිදුල සංවර්ධනය කිරිමේ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**කුරුවිට ප්‍රාදේශිය සභාවේ එල්ලාවල උපකාර්යාලය අසල ගිමන්හල ඉදිරිපිට කාණුව සැකසීම හා මිදුල සංවර්ධනය කිරිම සඳහා රු.1232000 .00 ගිවිසුම් අත්සන් කර ඇතත් රටේ පවතින මූල්‍ය අර්බුධය හරහා ඉදිකිරිම් ද්‍රව්‍ය මිල ඉතා අධික වී ඇති බැවින් දැනට පවතින මිල ගනන් අනුව ගිවිසුම් ගත මුදල තුලම අදාල ඇස්තමේන්තුව සංශෝධනය කර සති 6ක් ඇතුලත ඉදිකිරිම් සිදුකිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශියසභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ එල්ලාවල උපකාර්යාලය අසල ගිමන්හල ඉදිරිපිට කාණුව සැකසීම හා මිදුල සංවර්ධනය කිරිම සිදුකිරිමට රු.1232000 .00 ගිවිසුම් අත්සන් කර ඇතත් රටේ පවතින මූල්‍ය අර්බුධය හරහා ඉදිකිරිම් ද්‍රව්‍ය මිල ඉතා අධික වී ඇති බැවින් දැනට පවතින මිල ගනන් අනුව ගිවිසුම් ගත මුදල තුලම අදාල ඇස්තමේන්තුව සංශෝධනය කර සති 6ක් ඇතුලත ඉදිකිරිම් සිදුකිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-21.** **කුරුවිට ප්‍රාදේශිය සභාවේ එල්ලාවල උපකාර්යාලය ඇතුලත බිම ටයිල් අතුරා සංවර්ධනය කිරීමේ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කුරුවිට ප්‍රාදේශිය සභාවේ එල්ලාවල උපකාර්යාලය ඇතුලත බිම ටයිල් අතුරා සංවර්ධනය කිරීම සිදුකිරිමට රු.550000 .00 ගිවිසුම් අත්සන් කර ඇතත් රටේ පවතින මූල්‍ය අර්බුධය හරහා ඉදිකිරිම් ද්‍රව්‍ය මිල ඉතා අධික වී ඇති බැවින් දැනට පවතින මිල ගනන් අනුව ගිවිසුම් ගත මුදල තුලම අදාල ඇස්තමේන්තුව සංශෝධනය කර සති 6ක් ඇතුලත ඉදිකිරිම් කිරීමට යෝජනා කරමි.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ එල්ලාවල උපකාර්යාලය ඇතුලත බිම ටයිල් අතුරා සංවර්ධනය කිරීමරු.550000 .00 ගිවිසුම් අත්සන් කර ඇතත් රටේ පවතින මූල්‍ය අර්බුධය හරහා ඉදිකිරිම් ද්‍රව්‍ය මිල ඉතා අධික වී ඇති බැවින් දැනට පවතින මිල ගනන් අනුව ගිවිසුම් ගත මුදල තුලම අදාල ඇස්තමේන්තුව සංශෝධනය කර සති 6ක් ඇතුලත ඉදිකිරිම් සිදුකිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05 -22.** **පිටකන්ද අතුරුමාර්ගය සංවර්ධනය කිරිමේ යෝජනාව.**
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
**පිටකන්ද අතුරුමාර්ගය සංවර්ධනය කිරිම සඳහා රු.700000. 00 ගිවිසුම් අත්සන් කර ඇතත් රටේ පවතින මූල්‍ය අර්බුධය හරහා ඉදිකිරිම් ද්‍රව්‍ය මිල ඉතා අධික වී ඇති බැවින් දැනට පවතින මිල ගනන් අනුව ගිවිසුම් ගත මුදල තුලම අදාල ඇස්තමේන්තුව සංශෝධනය කර සති 6ක් ඇතුලත ඉදිකිරිම් සිදුකිරිමට යෝජනා කරමි.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව පිටකන්ද අතුරුමාර්ගය සංවර්ධනය කිරිමට රු.700000. 00 ගිවිසුම් අත්සන් කර ඇතත් රටේ පවතින මූල්‍ය අර්බුධය හරහා ඉදිකිරිම් ද්‍රව්‍ය මිල ඉතා අධික වී ඇති බැවින් දැනට පවතින මිල ගනන් අනුව ගිවිසුම් ගත මුදල තුලම අදාල ඇස්තමේන්තුව සංශෝධනය කර සති 6ක් ඇතුලත ඉදිකිරිම් සිදුකිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-23. කීරගල හිඟුරුපිල්ල ජලමූලාශ්‍ර පානීය ජල ටැංකියේ අබලන් වී ඇති ජල නල වෙනුවට නව ජල නල උපාංග ලබා දීමේ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**ලේකම්,එකමුතු සිතමු කාන්තා ගොවි සංවිධානය ,කීරගල ,කුරුවිට මගින් ඉල්ලිම් ලිපියක් යොමු කරමින් කීරගල, හිඟුරුපිල්ල ජල මුලාශ්‍රය ආශ්‍රිතව ඉදිකරල ලද කුඩා ටැංකියෙන් පවුල් 10 පමන ජලය පරිභෝජනය කරන බවත් මේ වන විට එම ජල නල කැඩි ජල සැපයුම අවහිර වී ඇති බවත් එම නල අළුතින් යෙදීමට තත්වයට පත්ව ඇතිබවත් සඳහන් කර ඇත.මේ වන විට එම පවුල් වලට මෙම කටයුත්ත අතින් මුදල් යොදා කරගත නොහැකි තත්වයට පත්ව ඇති බවත් එම අළුතින් යෙදිය යුතු උපාංග ලබාදෙන්නේ නම් කාන්තා ගොවි සංවිධනය මගින් සවිකරගත හැකි බවත් දන්වා ඇත.ඒ අනුව කීරගල හිඟුරුපීල්ල ජලමූලාශ්‍ර පානීය ජල ටැංකියේ අබලන් වී ඇති ජල නල වෙනුවට නව ජල නල උපාංග ලබා දීම සම්බන්ධව කාර්මික නිලධාරිවාර්තා ලබාගෙන ඉදිරි කටයුතු කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා :-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව කීරගල හිඟුරුපීල්ල ජලමූලාශ්‍ර පානීය ජල ටැංකියේ අබලන් වී ඇති ජල නල වෙනුවට නව ජල නල උපාංග ලබා දීම සම්බන්ධව කාර්මික නිලධාරිවාර්තා ලබාගෙන ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

## 05-24-ඇස්තමේන්තු

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

05-24-01 සිට 05-24- 06 දක්වා පහත ඇස්තමේන්තු අනුමත කිරීමටත් ප්‍රාදේශීය සභා අරමුදලින් සිදු කල නොහැකි කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු සඳහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතීන්

ලබාගෙන කටයුතු කිරීමටත් යෝජනා කරමි.එසේම කඳංගොඩ ක්‍රිඩාපිටිය සඳහා විදුලි ආලෝකය ලබා දිම ඇස්තමේන්තු පහත පරිදි මුදල රු.154360.00ලෙස සංශෝධනය කිරීමටත් යෝජනා කරමි.

05-24 -01 කඳංගොඩ ක්‍රිඩාපිටිය සඳහා විදුලි ආලෝකය ලබා දිම රු.100000.00

__ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -__

05-24 -01 කඳංගොඩ ක්‍රිඩාපිටිය සඳහා විදුලි ආලෝකය ලබා දිම රු.100000.00මෙම මුදල සංශෝධනය කරන අතර එය රු.154360.00 ලෙස සංශෝධනය කරමි.

05-24-02 පුස්සැල්ල උළුගෙදරවත්ත මාර්ගය කේ.ටී.ජිනපාල මයාගේ නිවස දෙසට යන මාර්ගය වාහනයක් ගමන් කල හැකි පරිදි පස් පුරවා සකස් කිරිම රු.620000.00

05-24-03 එරත්න ගඟබඩ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදි කිරිම රු.200000.00

(ගරු ප්‍රාසම කැළුම් ශ්‍රි ධර්මදාස මහතා)

05-24-04 තෙප්පනාව හල්දොල ඇලකපා පලල් කර ප්‍රදේශය ගංවතුරට යටවිම වැලැක්විම සඳහා සංවර්ධනය කිරිම රු.1000000.00

(ගරු ප්‍රාසම රුවන් අශෝක මහතා)

05-24-05.වලඳුර සිට පිටකඩ මුල්ල දක්වා මහඇල කපා රොන්මඩ හා අනවශ්‍ය ගස් ඉවත් කිරිම රු.1500000.00

05-24-06 තෙප්පනාව ගල්කඩ විමුක්ති ප්‍රජා ශාලාවේ පීලි දමා ඉතිරි කොටස නිමකිරිම රු.300000.00

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-__

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව** 05-24-1 සිට 05-24-06 දක්වා ඉහත ඇස්තමේන්තු අනුමත කිරීමටත් ප්‍රාදේශීය සභා අරමුදලින් සිදු කල නොහැකි කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු සඳහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතින් ලබාගෙන කටයුතු කිරීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

__**05-25-කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් බැවින් මුදල් ඉල්ලාසිටිම සම්බන්ධ යෝජනාව**__

පුස්සැල්ල ගොවිසංවිධානෙන්ඉල්ලිමක් කරලා. 158 - පුස්සැල්ල ගොවි සංවිධානය මගින් ලබාගන්නා ලද කුරුවිට ප්‍රාෙද්ශීය සබාවේ කම්කරුවන් සඳහා වූ විවේකාගාරයක් ඉදිකිරිම වැඩ අවසන් කර දැනට මාස කිපයක කාලය ඉකුත්වි ඇති අතර මුදල් තවමත් නොලැබුන බවත් වවුචර් හා බිල්පත් අමාත්‍යාංශයට යොමුකර ඇති බවත් ඒ අනුව කරන ලද ද්‍රව්‍ය හා සේවා කර්මාන්ත

සම්බන්ධව.ගෙවිමට ඇති බැවින් අමාත්‍යංශයෙන් මුදල් ලැබුණ පසු ප්‍රතිපූර්නය කරන තෙක් කුරුවිට ප්‍රාෙද්ශීය සභා අරමුදලින් මෙම මුදල ලබාදෙන ලෙස ඉල්ලා ඇත.ඒ අනුව 158 - පුස්සැල්ල ගොවි සංවිධානය මගින් ලබාගන්නා ලද කුරුවිට ප්‍රාෙද්ශීය සබාවේ කම්කරුවන් සඳහා වූ විවේකාගාරයක් ඉදිකිරිම වැඩ අවසන් කර දැනට මාස කීපයක කාලය ඉකුත්වි ඇති බැවින් හා මුදල් තවමත් නොලැබුන බැවින් හා කරන ලද ද්‍රව්‍ය හා සේවා කර්මාන්ත සම්බන්ධව ගෙවිමට ඇති බැවින් අමාත්‍යංශයෙන් මුදල් ලැබුණ පසු ප්‍රතිපූර්නය කරන තෙක් කුරුවිට ප්‍රාෙද්ශීය සභා අරමුදලින් මෙම මුදල් නීත්‍යානුකූලව ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>

50% ගෙවන්න යෝජනා කලා.බිල්දාලා යවලාද?ඒ ආවත් කොළඹින් ලැබෙනතෙක් සභාව ගිවිසුම් අත්සන් කරලා තියෙන්නේ.ඒවාට සභා තිරනයක් ගත්තා. සිමෙන්ති රු.2000.00. 2022 රේට් තියෙන්නේ.මේ මාසේ රේට් ආවම බලමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව හා** 158 - පුස්සැල්ල ගොවි සංවිධානයේ ඉල්ලීම් අනුව ලද කුරුවිට ප්‍රාෙද්ශීය සභාවේ වේ කම්කරුවන් සඳහා වූ විවේකාගාරයක් ඉදිකිරිම වැඩ අවසන් කර දැනට මාස කීපයක කාලය ඉකුත්වි ඇති බැවින් හා මුදල් තවමත් නොලැබුන බැවින් හා කරන ලද ද්‍රව්‍ය හා සේවා කර්මාන්ත සම්බන්ධව

ගෙවිමට ඇති බැවින්, අමාත්‍යංශයෙන් මුදල් ලැබුණ පසු ප්‍රතිපූර්නය කරන තෙක් කුරුවිට ප්‍රාෙද්ශීය සභා අරමුදලින් මෙම මුදල් නීත්‍යානුකූලව ලබාදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**<u>06.කාරක සභාවල වාර්තා</u>**

06-01 මුදල් කමිටු වාර්තාව

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

22.04.04 දින **මුදල් කමිටු වාර්තාව** සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් **මහා** සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන මහතා :-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

වාර්තාවේ තීරන අංක 33 ගරු සභාපතිතුමාගේ කැබ් රථය අළුත්වැඩියා කල කාලය තුල වෙන කැබ් රථයක් කුලියට අරන්.සභාවේ කැබ් රථය දින 10 ක් අළුත්වැඩියා කරලා.ගෙවීම් වාර්තාවේ අංක 168 යටතේද මෙය සඳහන්. සභාවේ තව කැබ් රථයක් තියෙනවා.මිට්ෂුබිසි රථය.ඒකේ අවශ්‍ය ගමන් සිදුකිරිමට තිබුණා. මේ ගමන් යන්නේ සමාජ සේවය සඳහා.නමුත් මහජන මුදල් රු.105650.00ක් දින 10ට යොදවලා. පූර්ව අනුමැතිය අරන් නෑ.මේ මුදල දරන එක සුදුසු නෑ.මේ මුදල ගාන වැඩියි.ඩිසල් රියදුරු දෙකම පිටින්ද?පූර්ව අනුමැතිය අරන්නෑ. මම මේ ගෙවිමට එකඟ නෑ.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

රියදුරු අපෙන්.මම ගමන් කිරිමේදි කැබ් රථය ආපදාවටලක් වුනා.මම අනුරාධපුර රැස්විමට ගියෙත් ජීප් එකේ.ගෙවන ගානක් තියෙනවා.සභා අනුමත ගානක්.හදිසියේ ගත්තේ.නිල් කැබ් රථය කිසිදු ගමන් පහසුවක් නෑ. එසේම .දුර යන්න බෑ.මෙවැනි අවස්ථා වලදි නිල රථය වෙනුවට වෙනත් රථයක් ගන්න පුවවන්.සභා තීන්දුව ගන්න ඕනි.සභා මේ ගෙවීම බෑ කියනවා නම් කමක් නෑ. අතින් හරි ගෙවන්නම්.

නමුත් මෙය මට ගැනීමේ අයිතියක් තියෙනවා.සෙනරත් අප්පෝ ඉන්න කාලෙත් ගත්තා.කිලෝ මිටර් ගානටයි ගෙවන්නේ.මේ අදාල මුදලයි. සියළු වාර්තා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

එසේ අයිතියක් තියෙනවා. නමුත් නමුත් සභාවේ කැබ් එකේ යන්න තිබුනා.අවම පහසුකම් ගන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

සභාවේ විවිධ කටයුතු තියෙනවා.මේ වැරැද්ද කුමක්ද? මම ගිය නිසාද?අවම පහසුකම් තමයි.නීත්‍යානුකූල නැත්නම් වගකීම භාර ගන්නවා.කොම්පැනි දැම්මා දින 10 ක් ගියා.දවස් දෙකටයි මම ගත්තේ .නමුත් දින 10ක් ගියා.නිල් කැබ් රථයේ යා නොහැකියි.සභාවේ මතය යි වැදගත් වන්නේ.අදහස් ප්‍රකාශ කලහැකියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-**

මෙය නීත්‍යානු කූලව වියයුත්තක් බවයි කියන්නේ.ගිය සභාවේ කීවනේ මුදල් කමිටුව හරි කියලා. විනිවිදව කරන්න.මංගල මන්ත්‍රිතුමා කියන දේ තුල ගත යුත්තක් තියෙනවා.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

වැරදි ප්‍රකාශයක් .මුදල් කමිටුව ගැන කතා කිරිමට එපා කියලා නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා :-**

අපි මේ කටයුත්තට නිර්දේශ දුන්නා.ඒ ගැන ගැටළුවක් නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා :-**

මෙය හදිසි කටයුත්තක්. හදිසියේ ගමන යන්න මේ කමිටුවට දම දමා බෑ. ඒ නිසයි ආවරන අනුමැතියට යටත්ව අරන් තියෙන්නේ.මේවා බලලා කතා කරන්න.චෝදනා පමනක් එපා. මුදල් කමිටුවෙන් ඉවත් කලොත් යනවා.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**
ක්‍රම වේදය ඉදිරිපත් කරන්න. තවත් නිවැරදි කල හැකියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති විජේසිරි මහතා :-**
ඔබතුමාම වාහනය අරන්.මුදල් කමිටු අනුමැතියත් දිලා.සභාවේ අවශ්‍ය කටයුතු වලටයි යන්නේ.තමන්ට තියෙන වාහනය කැඩිලා නිසා.මේ කටයුත්ත නිත්‍යානුකූලයි නම් ගැටළුවක් නෑ.එකඟයි.ඒ ගෙවීමට.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx 2022.04.04 වන දින මුදල් කමිටු වාර්තාව සහා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-02 කාර්මික කමිටු වාර්තාව (2022.03.23)

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

22.03.23 දින **කාර්මික කමිටු වාර්තාව** සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-**

22.03.23 දින කාර්මික කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණී දයා කස්තුරි මිය-**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රන්ජන් ප්‍රදීප් මහතා-**

මම දිගටම මේ කමිටුවට ආවා.ගියවර බැරි උනෙ අසනීප නිසා.මම තනියම බොහෝ වෙලාවට.මංගල මන්ත්‍රිතුමා ඉවත් වුනා.කව්රු හරි දාන්න.එන කෙනෙක් දාන්න.ඔබතුමාත්, ලේකම්තුමියත් නෑ.කාර්මික නිලධාරීත් නෑ.විෂය නිලධාරි විතරයි.මේවා නිසි ලෙස කටයුතු කරගන්න බෑ.

ට්‍රැක්ටර් ජේ.සිබි. අත්‍යවශ්‍යයි. අපිට අනුමත කරන්න බෑ.මමත් වැඩ කරන කෙනෙක්.මටත් තනියම බෑ. වෙන අය පත්වෙන්න. මෙහෙම වැඩක් නෑ.නැත්නම් මාත් අස් වෙනවා.
රත්නසිරි මන්ත්‍රිතුමා අසනීපයෙන් නිසා බෑ.ශානක මන්ත්‍රිතුමාට ත් රැකියා කටයුතු සමග බෑ කීවා.වෙන අය දාන්න කීවා.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

ඇත්ත. මේ තත්වය මත වෙන අය පත්කරන්න වෙනවා.ඒ අනුව
ගරු රත්නසිරි මන්ත්‍රිතුමා ගරු ශානක මන්ත්‍රිතුමාවෙනුවට ගරු කැළුම් ශ්‍රී ධර්මදාස මන්ත්‍රිතුමා , ගරු රංජිත් මෙන්ඩිස් මන්ත්‍රිතුමා ,පත්කිරිමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය -**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx 22.03.23 දින කාර්මික කමිටු වාර්තාව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-03 කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායකකමිටු රැස්වීම් වාර්තාව.(2022.03.16)

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

මෙය සභාවේ දැන ගැනීම සඳහා යොමු කර ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-**

ලැබීම් ගෙවීම් වාර්තාද දාන්න.විෂය දැනුවත් කරන්න.

## 07 ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

07-01 -2022 පෙබරවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

2022 පෙ බරවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණී දයා කස්තුරි මිය-**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

සභාවේ අක්කර බදු විශාල ප්‍රමානයක් හිඟයි.ආදායම් පරිපාලකගේ වැඩක්.පිලියමක් කරන්න.

පොදු වෙළඳ පලත් හිඟයක්. නඩු දමා හෝ ඉවර කර ගන්න. පරිපාලන කටයුත්තක්.තාවකාලික කඩත් එහෙමයි.නිලධාරීන් යවලා සමත මණ්ඩලයට හෝ දමන්න.කඩ වලත් ගෙවන්නැති ඒවා සභාවට ගන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

ඉඩම් සම්බන්ධගැටළු වලට ග්‍රාම නිලධාරි වාර්තා අරන් තීරන ගමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**2022 පෙබරවාරි මස **මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

07-02 2022 මාර්තු මස ගෙවීම් වාර්තාව

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

2022 මාර්තු මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා :-**

2022_මාර්තු මස ගෙවීම් වාර්තාව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා :-**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-**

සියළු ගෙවීම් පිළිබඳව දැඩි අවධානයෙන් කටයුතු කරන්න.ගමන් වියදම් ගන්නා නිලධාරින් ඒවා අවංකව කරන ලද සේවයක් වෙනුවෙන්ම ගනු ඇතැයි විශ්වාස කරනවා.විචේචන නොවන ලෙස කටයුතු කරන්න.මනා කලමනාකාරීත්වයෙන් යුතුව කටයුතු කරන්න.මේ සම්බන්ධව අවධාරනය කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් මහතා :-**

ගෙවීම් වාර්තාවේ අංක 64,භාණ්ඩ සමීක්ෂන ගමන් වියදම්,අංක 87,යතුර රැගෙන ඒමට ගමන් වියදම් ගෙවීම සම්බන්ධව විමසා ගැටළු නිරාකරනය කරගන්නා ලදී.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx 2022 මාර්තු මස ගෙවීම් වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

08.වෙනත් කරුණු.

**08—01 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා ගේ පියාගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කිරිම:-**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-**

අපේ එල්ලාවල ප්‍රාදේශිය සභා උප කාර්යාලයේ මුර සේවය සිදු කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා ගේ පියානන් රාජකාරියට යන අතරේ රිය අනතුරකට ලක්වෙලා අභාවයට පත් වුනා.සහෝදර මන්ත්‍රි වරයාගේ පියා.වගේම අපේ සහෝදර සේවකයෙක්.එමනිසා මේ සහෝදර මන්ත්‍රි වරයාගේ පියාගේ අභාවය වෙනුවෙන් සංවේගය ප්‍රකාශ කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන විජේසිරි මහතා :-</u>**

මගේ ඥාති සහෝදරයෙක්.ලීලාරත්න මහතා ආයතන ගනනක සේවය කර අත්දැකීම් ඇති අයෙක්.සමුපකාර සමිතියේ කලමනාකාරවරයෙකු ලෙසත් සේවය කර තිබෙනවා.දීප්තිමත් පවුලක් වැදගත් ලෙස ජිවත්වූ අයෙක්.එසේම සභාවේ සේවකයෙකු ලෙසත් එතුමා සේවය ලබා දුන්නා.දීර්ග දේශපාලන ඉතිහාසයක් සතුයි.මම සමුපකාර අධක්ෂ මණ්ඩලයට පත්වෙන කොට එතුමා දෙල්ගමුව නියෝජිතයෙකු ලෙස හිටියේ.කැපවී එතුමා කටයුතු කලේ. එතුමාගේ වියෝව පාඩුවක්.සංවේගය පල කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් දේශප්‍රිය මහතා :-</u>**

මෙතුමාගේ අභාවය පිලිබඳව මා දැනුවත්ව හිටියේ නෑ.මාදන්නා පරිදි මේ පියා කැපවී කටයුතු කල සමුපකාර කලමනා කාර වරයෙක්.අපේ සභාවේ සේවකයෙක්.මෙතුමා ඒ වගේම දීප්තිමත් තරුන දේශපාලකවරයෙකුගේ පියා.ක්‍රිඩාව ජයගත් මන්ත්‍රිවරයෙකුගේ පියා.බුදු දහම අනුව මෙතුමා නිවන් සුව පතමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා :-</u>**

ලීලේ අයියා සමුපකාරසේවාව දියුනු කිරිමට වෙහෙස වූ අයෙක් වගේම සබාවේ සේවකයෙක් එතුමා වෙනුවෙන් සංවේගය පල කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා</u>**

මගේ පියානන් අහිමි වුනේ සේවයට යන ගමන්.දින 3ක් එක දිගට වැඩ කරලා යද්දී.ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මන්ඩලය ලබාදුන් සියළු සහායන් වෙනුවෙන් ස්තුතියි.රෝහලේ සිට අවසන් කටයුතු දක්වා සහාය වුනා.රාත්‍රි කෑමවේල දුන්නා.කාට උනත් අමාරුයි. තනියම බෑ.මාත් කාට උනත් උදව් කරනවා.ඒක හරි වටිනවා.එකතුවෙලා මේ උදව් කරන එක වටිනවා.
අපි නඩු කියන්නේ නෑ.අපිට ගන්න ඕනි නෑ.තුන්මාසේ දානෙට කව්රුත් එන්න.ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන මහතා :-</u>**

මාත් මේ අවස්ථාවේ ශෝකය පල කරනවා.මේ වගේ වෙලාවල හැමෝම ගිහින් සහාය වෙමු.කවුරුත් එකට ගියා නම් හොඳයි.මූලික වෙලා මේ වෙලාවල වැඩ කරමු.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**

දිගු කාලයක් ජනතාව අතර සිටි අයෙක්.ලීලෙ අයියා ජනතාවගේ හිතවතෙක්.අවසාන කාලෙවත් රටට බරක් වුනේ නෑ.සබාවේ තාවකාලික මුර තනතුරක් අරන් සේවය කලා.ඒ සේවයට යන ගමන් අවසන් ගමන් ගියේ.එතුමා නිරෝගී අයෙක්.හදිසියේ අභාවයට පත් වුනේ.එතුමාට නිවන්සුව පතමු.

08-02

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා :-</u>**

උඩවත්ත පාලම ලඟ ගැටළුව.මේ සම්බන්ධව ඉහතදීත් දැනුවත් කලා. කාර්මික නිලධාරි බැලුවා.පාරේ කානුව දාන්නඕනි කියලා දැන් නැවතිලා.බෝක්කු දානවා කියලා. ප්‍රේමා මන්ත්‍රි තුමිය ඒ කපපු කානුව වැහුවා.මේ වෙනකොට අඩි දෙකක් විතර ජලයෙන් යට වෙනවා.බයිසිකලයකටවත් යන්න බෑ.පවුල් දෙකයි යන්නේ.මම ලක්ෂ 5 දිලා පාර හැදුවේ.පාර නැවැත්තුවේ බෝක්කු දානවා කියලා.කපාපු කානුවත් වැහුවා.ජනතා විරෝධයක්.මේ කානුව කපලා දෙන්න. වැසි කාලේ කඩිනමින් කටයුතු කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී ප්‍රේමා  ගම්ලත් මිය  :-</u>**

ගරු සභාපතිතුමත් මේ ස්ථානයට ගියා.බෝක්කුව දාන තැන පල්ලම් කරලා.ඒකයි ගැටළුව. දොස් කියනවා ගමම.බෝක්කුව දාන්න ඕනි.එතෙක් පාර කපන්න දෙන්නේ  නෑ.

මේ අවස්ථාවේ සභාවේ දැඩි ගෝෂා පැවතුණි.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල  මහතා:-</u>**

මෙම ගැටළුව අපි විසඳමු.කාර්මික නිලධාරි යවා වාර්තා අරන් ගැටළුව විසඳමු.

08-03.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති විජේසිරි මහතා :-</u>**

ආදාහනාගාරයේ ජෙනරේටරය කාර්මික දෝෂයක්.මිකී දෙකක් අරන් ගිහින්.විදුලිය නැති නිසා ප්‍රමාද වෙලා ඒ කටයුතු වලට.කඩිනමින් හදල දිගු කාලීනව පවත්වාගෙන යන්න.නැත්නම් ගැටළුවක් වෙයි.

08-04

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

ගරු රත්නසිරි මන්ත්‍රීතුමා අසනීපයෙන් .දිගුකාලීනව ප්‍රතිකාර.ඒ නිසා අපි සභාවක් ලෙස යුතුකමක් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

සභාවෙන් නීත්‍යානුකූලව දියහැකි දෙයක් ද දෙමු.

08-05 **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා :-**
2022.03.25 පාන්දර 6ට මාව හොයාගෙන කුරුවිට පොලිසියෙන් ආවා.මං හිටපු පතල් පොලට ඇවිතු අධිකරන නියෝගයක් දුන්නා.පැරඩයිස් හන්දියේ පැවැත්වීමට නියමිත උද්ගෝෂනය ගැන කියලා. නමුත් දැන් ගම, රට පුරා උද්ගෝෂන.මේ උද්ගෝෂන කොහේවත් මං කරපුවා නෙමේ.ප්‍රශ්න නිසා .අධිකරනයමගේ නමට ලිපියක් යොමු කරලා.

මේ පොලිසියට අධිකරනය දක්වා යනතුරු කව්ද තොරතුරු දෙන්නේ.

එදා උද්ගෝෂනයේ නරක දෙයක් කලානම් මාවයි අත්අඩංගුවට ගන්නේ.පොලිසියට ඇවිත් ඉන්නේ බුද්ධිමත් අයෙක්.එතුමා මේගැන නියම අයුරින් දැක්කා.අද ගෑස් නෑ.
සභාවේ දැඩිගෝෂා..
කුරුවිට තියෙන් උද්ගෝෂන වල මගේ නම කියවීම මට ගැටළුවක්.මගේ ගම.මට නවත්වන්න බෑ.අපි සභාව තුල සාමකාමීව ඉන්නවා.අහිංසක මිනිස්සු පෝලිම්වල.මේ රට ගොඩනගන විධිහක් බලමු.රටේ තත්වය අනුව අපි ආර්ථිකය කලමනාකරනය කරගන්න ඕනි.මේ විධිහට නම් භාවිතා කරලා අපහසුතාවට පත්කිරිම මා හෙලා දකිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජන් ප්‍රදීප් මහතා :-**

අපි මේබල ප්‍රදේශයේ මහජන නියෝජිතවරු. අපි සහයෝගයෙන් කටයුතු කරන්නේ.දේශපාලනයෙන් තොර පිරිසක් කළු කොඩි අරන් උද්ගෝෂන කරනවා.මම අඳුරන අය නිසා කතා කලා.අධික බීමතින් සිටි පිරිසක් ගිනි තියලා පාරේ .අර මිනිස්සු පිටින් යන්න.
රටේ උද්ගත තත්වයට මුන දෙන්න පාර්ලිමේන්තුවේ ලොකු අර්බුධ.අපිත් විරෝධය පෑවා.සෑම සභාවකටම එහෙම කරන්න කියලා තියෙනවා.මෙතුමාට පැරඩයිස් හන්දියේ කරන්න ඕනිනෑ.කඩේකට ගලක් ගැහුවානම් මෙතුමාව අරන් යනවා. අපි භීෂනය කරන්නේ නෑ.නිහඬ කළු කොඩිඅරන් කල දෙයක්. පාර්ලිමේනුතුවෙන් නිසි පිලිතුරු නෑ.බිම් මට්ටමේ අයයි කතා කරන්නේ.මම පුද්ගලිකව මුලස්ථාන පොලිසියට දැනුම් දුන්නා. මේ වගේ දේ ඔබතුමාලටත් හොඳයි.දැනුවත් වෙන්න.අධිකරනය දදැනුවත් උනේ කොහොමද? මේ දේ කලේ කව්ද? මාත් ප්‍රජා පොලිස් ඒකකයේ ඉන්නවා.අපි ප්‍රධාන නගරයෙයි කරන්නේ. මන්ත්‍රී ආරක්ෂාවට පූර්ව ක්‍රමවේද අවශ්‍යයි.

-

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-**

කනගාටුයි.අපි මේ සේරම එක්විය යුතු අවස්ථාවක්.මටත් දරුවෝ ඉන්නවා.77 න් පස්සේ සිටි සියල්ලන් මේ තත්වයට වග කියන්න ඕනි.අපේ කව්රුත් මෙවැනි දේ කරන්නේ නෑ.මේක අයිතියක්.විපක්ෂ නායක තුමාට සිදුවු දේ සම්බන්ධව පරීක්ෂනයක් තියන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

ස්ථානාධිපතිතුමා හමුවෙලා කතා කරමු.ඔය සම්බන්ධව අපිත් එකඟයි.අපිත් අමාරුවේ.පෝර සම්බන්ධව නම් මම කීවා ජනතාවට ගැලපෙන්නේ නෑ කියලා.අපිත් විරුද්ධයි.නමුත් මේ උසිගන්වන කාන්ඩ වලට ඕනි රට අරාජක කරන්න.71,88,89 වගේ තව ඒවා වෙයි.නමුත් ගම්වල මිනිසුන් ආරක්ෂා විය යුතුයි.අපේ ප්‍රශ්න වලට විසඳුම් දෙන්න කියලා අපි නායකයින්ට කීවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා :-**

**ප්‍රාදේශීය සභාව අවුරුදු 4ක් පුරා විවාද කලාට අපි අතර තරහක් නෑ.ආණ්ඩුව අර්බුධයක. අපි අර්බුධයෙන් එකතුවෙලා ගොඩයන්න ඕනි.අපි දන්නවා සභාවේ උද්ගෝෂනවලට මෙතුමන්ලා හිටියේ නෑ. නමුත් මෙවැනි උසාවි නියෝග නිසා ගැටළු.අපක්ෂපාති පරික්ෂනයක් කරන්න.**

අපේ ගම්වල නොවුනාට මේ කුරුවිට ගැටළු ඇතිවෙන්න පුළුවන්.හැමතැනම උද්ගෝෂන.45 දෙනාගේම ආරක්ෂාව අවශ්‍යයි. මෙවැනි දේ මානසික පීඩා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා :-**

රටේ වත්මන් පවතින තත්වය අනුව උද්ගෝෂන ආදිය සිදුවෙනවා.ඒවාට අයිතිය තියෙනවා.නමුත් විවිධ කඩාකප්පල් කාරි ක්‍රියා කරලා වෙනත් පාර්ශව වලට බැර කරනවා.දේවින්ද මන්ත්‍රිතුමාට එවැනි ලිපියක් ආවේ කොහොමද? යම් කුමන්ත්‍රන තියෙන්න පුළුවන්.විශේෂ අවධානය යොමුකරන්න.මේ පස්සේ විවිධසිද්ධි මතු කරලා රට අරාජක කිරීමේ වගකිම පවරන්න උත්සහ කරනවා.ඔබතුමාට වගේ තවත් පාර්ශව වලට මෙය විය හැකියි.83 කළු ජූලිය පක්ෂය සම්බන්ද නැතත් වගකීම පැටෙව්වා. දේවින්ද මන්ත්‍රිතුමාගේ ගැටළුව පිලිබද කණගාටුව පල කරමි.රටක්ලෙස සිටින තත්වයෙන් ගොඩ ඒමට අපි මැදිහත්වෙන්න අවශ්‍යයි.විසඳුමක් තාම නෑ.අපි රට ගොඩ එන විධිහයි කතා කරන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්ද්‍රන මහතා :-**

ජනතා නියෝජිතයින් ලෙස අපි මහජන ජන්දෙන් ආ පිරිසක්. ජනතාව විඳින දුක පීඩනය අපිට තේරෙනවා.විශාල අර්බුධයක . නමුත් මේ තත්වය සමහර තැන්වල නින්දිත විධිහට උද්ගෝෂන. අශීලාචාර ලෙස.සමාජ මාධ්‍ය ජාලාවල පහත් තත්වයට පත් වෙලා.මටත් එවැනි පෝස්ට ලැබුනා.ෂෙයා වෙනවා. නීතියට ගියාම ඒවා අතුරුදන්වෙලා.ගංවල ජලබලය තියෙන කෙනාටත් ලැජ්ජාවට පත්වෙන තත්වයක්.කලාවක්වෙලා මේ අසභ්‍ය වැඩ.මේ දේවින්ද ගරු මන්ත්‍රිතුමාට සිදුවු කරුන සම්බන්ධව අදාල අංශ දැනුවත් කරන්න.අවශ්‍ය පියවර ගන්න.

මේ අවස්ථාවේ ගරු මන්ත්‍රිතුමන් විසින් දීර්ඝ ලෙස මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

සභාවේ 45 දෙනාම මේ පිලිබඳ අවබෝධයෙන් ඉන්න.දේවින්ද මන්ත්‍රිතුමා සම්බන්ධ ගැටළුව අපි සියළු අංශ ජේෂ්ඨ පොලිස් අධිකාරිතුමා,දැනුවත් කරමු.මටත් විවිධ අවස්ථාවල පොලිසියෙන් කතා කලා.ස්ථානාධිපතිතුමා,සීඅයිඩි. ට්‍රැපික් ඕ.අයි.සි. කතා කරලා කීවා යන්න කියලා.සමාජ මාධ්‍ය ජාලාවල විවිධ කතා.කෙසේ උවත් මෙවැනි ගැටළු වෙන දේ ගැන අවධානයෙන් ඉන්න.

-09-හදිසි යෝජනා

09-01 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා

ශ්‍රිපාදඑරත්න මාර්ගය ගමන් කරන බැතිමතුන්ට විවිධ අපහසුතාවයන්ට පත්වී ඇති බැවින් වර්නගල සිට හැරමිටිපාන දක්වාමාර්ගයේ දුෂ්කරස්ථාන ගමන්කිරිමටපහසු අයුරින් සංවර්ධනය කිරිම හා වර්නගල වාහන නවතා තැබිමට අවශ්‍ය රථගාල් කීපයක් ඉදිකිරිමට යෝජනා කරමි.

මේ වාහන ගාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉඩම් පවරාගෙන සභාවට ආදායමක් එන ලෙස කරමු.

ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා :-
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

> **Xxxxxxxxxxxxxxx**_**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී_මහින්ද විජේකුමාර මහතාගේ යෝජනාව අනුව** ශ්‍රීපාදඑරත්න මාර්ගය ගමන් කරන බැතිමතුන්ට විවිධ අපහසුතාවයන්ට පත්වී ඇති බැවින් වර්නගල සිට හැරම්ටිපාන දක්වාමාර්ගයේ දුෂ්කරස්ථාන ගමන්කිරිමට පහසු අයුරින් සංවර්ධනය කිරිම හා වර්නගල වාහන නවතා තැබිමට අවශ්‍ය රථගාල් කීපයක් ඉදිකිරිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

9-02. නිවාඩු අනුමත කිරීම

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**
**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රත්නසිරි මහතා හදිසියේ_අසනිප වි ඇති අතර නිවාඩු ලබා දිමට යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.**
**ගරු උපසභාපති අසංක දිල්ෂාන් මහතා :-**
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

> **Xxxxxxxxxxxxxxx**_**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.රත්නසිරි මහතා_අසනීප වි ඇති අතර නිවාඩු ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

- **ස්තූතිය.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

අද දින මහා සභාව සඳහා සහභාගිවී සහය ලබාදුන් සියළු දෙනා හට ස්තූතිය පල කරමි. සභාවේ කටයුතු ප.ව. 1.30 ට පමණ අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -
01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී(දැ.ග.පි.)

**02.**ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන.-රත්නපුර දිස්ත්‍රික් ලේකම්තුමිය විසින් කුරුවිට ප්‍රාදේශීය සභාවේ ගත් සභා තීරනයක් සම්බන්ධව දැනුවත් කරමින් යොමු කර ඇති 2022.03.06 දිනැති ලිපිය.

**03.**යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

- **ස්තූතිය.**

ප්‍රේමරත්න මල්කැකුළ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,කුරුවිට